# මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය

33 කලාපය පළමුවන වෙළුම
2025 ජූනි

# THE JOURNAL OF THE FACULTY OF HUMANITIES

**VOL. 33, ISSUE 1**
**2025 JUNE**

කැලණිය විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකාව

මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය
33 කලාපය පළමුවන වෙළුම

© ලිපිවල අයිතිය හා සෙසු සියලු වගකීම් ඒ ඒ ලේඛකයන් සතුය.

**ISSN (Print): 1391-5096**
**ISSN (Online): 2783 – 8951**

***The Journal of the Faculty of Humanities* (JHU) is an Open Access journal distributed under the terms of the Creative Commons Attribution license (https:// creativecommons.org/licenses/by/4.0/), which permits unrestricted re-use, distribution, and reproduction in any medium, provided the original work is properly cited.**

කංචුක සැලසුම: දිවංක රන්දුල පොද්දුවගේ
සහන් උත්පල සඳරුවන්

පරිගණක අක්ෂර සංයෝජනය
සහ පරිගණක පිටු සැකසුම: ඩිලන්ත මුතුගල

මුද්‍රණය: විද්‍යාලංකාර මුද්‍රණාලය,
පෑලියගොඩ

ප්‍රකාශනය: මානවශාස්ත්‍ර පීඨය,
කැලණිය විශ්වවිද්‍යාලය

# මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය

33 කලාපය පළමුවන වෙළුම
2025 ජූනි

**උපදේශක සංස්කාරකවරු**
විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
පූජ්‍ය නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි

විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
උපුල් රංජිත් හේවාවිතානගමගේ

විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
මෛත්‍රී වික්‍රමසිංහ

**ප්‍රධාන සංස්කාරක**
මහාචාර්ය අනුරින් ඉන්දිකා දිවාකර

**සංස්කාරකවරු**
ආචාර්ය සරසි කන්නන්ගර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අනුරාධ සුබසිංහ

**මානවශාස්ත්‍ර පීඨය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**ශ්‍රී ලංකාව**

**THE JOURNAL OF THE FACULTY OF HUMANITIES**
Vol. 33, Issue 1

**© Copyright and responsibility reserved by individual writers**

**ISSN (Print): 1391-5096**
**ISSN (Online): 2783 – 8951**

*The Journal of the Faculty of Humanities* (JHU) is an Open Access journal distributed under the terms of the Creative Commons Attribution license (https:// creativecommons.org/licenses/by/4.0/), which permits unrestricted re-use, distribution, and reproduction in any medium, provided the original work is properly cited.

| | |
|---|---|
| **Cover Design:** | Divanka Randula Podduwage<br>Sahan Uthpala Sandaruwan |
| **Page Layout:** | Dilantha Muthugala |
| **Print:** | Vidyalankara Press, Peliyagoda |
| **Published:** | Faculty of Humanities,<br>University of Kelaniya |

# THE JOURNAL OF THE FACULTY OF HUMANITIES


## VOL. 33, ISSUE 1

**2025 JUNE**



**Advisory Board**
Cadre Chair and Snr. Prof. Ven. Nabirittankadawara Gnanaratana Thero
Cadre Chair and Snr. Prof. Upul Ranjith Hewawithana Gamage
Cadre Chair and Snr. Prof. M.K. Wickremasinghe

**Editor-in-Chief**
Professor Anurin Indika Diwakara

**Editorial Board**
Dr. Sarasi Kannangara
Senior Lecturer Anuradha Subasinghe



**Faculty of Humanities**
**University of Kelaniya**
**Sri Lanka**

# ලේඛකයෝ

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ**
*බීඒ., එම්ඒ., පීඑච්ඩී. (ශ්‍රී ජ'පුර)*
*විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, භාෂා, සංස්කෘතික අධ්‍යයන හා*
*ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය,*
*ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය*

**මහාචාර්ය බිහේෂ් ඉන්දික සම්පත්**
*බීඒ. (ශ්‍රී ජ'පුර), එම්ෆිල්. (රුහුණ), පීඑච්ඩී. (බෞද්ධ හා පාලි වි.වි)*
*මහාචාර්ය, සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*

**චන්දන රුවන් කුමාර**
*බීඒ. (කැලණිය), එම්ඒ. (දිල්ලි) එම්ෆිල්. (කැලණිය)*
*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ලලිත කලා අධ්‍යයන අංශය,*
*කැලණිය විශ්වවිද්‍යාලය*

**උඩවෙල රේවත හිමි**
*බීඒ. (කැලණිය), එම්ෆිල්. (කැලණිය), රාජකීය පණ්ඩිත (ප්‍රා.භා.ස.)*
*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංස්කෘත සහ පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයන අංශය,*
*කැලණිය විශ්වවිද්‍යාලය*

**ආචාර්ය ජගත් බණ්ඩාර පතිරගේ**
*බීඒ. (කොළඹ), එම්එස්සී. (එඩින්බරා), පීඑච්ඩී. (ඕස්ට්‍රේලියාව),*
*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජවිද්‍යා අධ්‍යයන අංශය,*
*කොළඹ විශ්වවිද්‍යාලය*

**ආචාර්ය රමණී රත්නමාලි ජයසිංහ**
*එම්එස්සී. (පේරාදෙණිය), එම්ඒ. (කැලණිය), පීඑච්ඩී. (ඉන්දියාව),*
*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශය,*
*කැලණිය විශ්වවිද්‍යාලය*

**ඉන්දික මුණවීර**
*බීඒ., එම්ඒ. (කැලණිය)*
*කථිකාචාර්ය, වාග්විද්‍යා අධ්‍යයන අංශය*

**ඒ. එම්. ජී. ආර්. මධුශානි**
*බීඒ., එම්ෆිල්. (කැලණිය)*
*කථිකාචාර්ය, සංස්කෘත සහ පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයන අංශය,*
*කැලණිය විශ්වවිද්‍යාලය*

# Contributers

**Senior Professor Saman Chandra Ranasinghe**
*BA., MA., PhD. (USJ)*
*Cadre Chair and Senior Professor, Department of Languages, Cultural Studies and Performing Arts. University of Sri Jayewardenapura*

**Professor Bihesh Indika Sampath**
*BA. (USJ), MPhil. (Ruhuna), PhD. (B & P Uni)*
*Professor, Department of Sinhala, University of Kelaniya*

**Chandana Ruwan Kumara**
*BA. (Kelaniya), MA. (Delhi), MPhil. (Kelaniya)*
*Senior Lecturer, Department of Fine Arts, University of Kelaniya*

**Rev. Udawela Rewatha Thero**
*BA. (Kelaniya), MPhil, (Kelaniya), Royal Pandit (OSS)*
*Senior Lecturer, Department of Sanskrit & Eastern Studies, University of Kelaniya*

**Dr. Jagath Bandara Pathirage**
*BA. (Colombo), MSc. (Edinboro), PhD. (Australia)*
*Senior Lecturer, Department of Sociology, University of Colombo*

**Dr. Ramani Rathnamali Jayasinghe**
*BSc. (Peradeniya), MA. (Kelaniya), PhD. (India)*
*Senior Lecturer, Department of English Language Teaching,*
*University of Kelaniya*

**Indika Munaweera**
*BA., MA. (Kelaniya),*
*Lecturer, Department of Lingustics, University of Kelaniya*

**A. M. G. R. Madhushani**
*BA., MPhil. (Kelaniya)*
*Lecturer, Department of Sanskrit & Eastern Studies,*
*University of Kelaniya*

# තීරකයෝ

**සම්මානිත මහාචාර්ය ආර්. එම්. ඩබ්ලිව්. රාජපක්ෂ**
*බීඒ., එම්ඒ. (කැලණිය), එම්ඒ. (යෝර්ක්), පීඑච්ඩී. (ලන්ඩන්)*

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අනුර මනතුංග**
*බීඒ. (කැලණිය), එම්ඒ. (පූනේ), එම්එස්සී. (කැලණිය),*
*අධිසමාජික - ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සභාව*

**මහාචාර්ය කේ. බී. ජයවර්ධන**
*බීඒ. (කැලණිය), එම්ඒ., පීඑච්ඩී.*
*(බරණැස හින්දු විශ්වවිද්‍යාලය, ඉන්දියාව)*

**මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි**
*බීඒ., එම්ඒ. (කැලණිය), පීඑච්ඩී. (පූනේ), රාජකීය පණ්ඩිත*

**මහාචාර්ය මල්වානේ චන්දරතන හිමි**
*බීඒ., එම්ෆිල්. (කැලණිය), පීඑච්ඩී. (පූනේ)*

**මහාචාර්ය ස්වර්ණා ඉහළගම**
*බීඒ., එම්ෆිල්. (කැලණිය), පීඑච්ඩී. (වුහාන්)*

**මහාචාර්ය ප්‍රශාන්ති නාරංගොඩ**
*බීඒ. (කැලණිය), එම්එස්සී.*
*(පුරාවිද්‍යා පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය), පීඑච්ඩී. (ඇමරිකාව)*

**ආචාර්ය කපුගොල්ලෑවේ ආනන්ද කිත්ති හිමි**
*බීඒ. (කැලණිය), එම්ඒ., පීඑච්ඩී. (පූනේ)*

**ආචාර්ය කල්‍යාණි විජේසුන්දර**
*බීඒ. (කොළඹ), එම්ඒ., පීඑච්ඩී. (කැලණිය)*

**ආචාර්ය වින්ධ්‍යා වීරවර්ධන**
*බීඒ., එම්ඒ., එම්ෆිල්., පීඑච්ඩී. (කැලණිය)*

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ලංකා ද සිල්වා**
*බීඒ. (කැලණිය), එම්එස්සී. (මොරටුව)*

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නීල් පුෂ්පකුමාර**
*බීඒ., එම්ඒ. (පේරාදෙණිය), එම්ඒ., එම්ෆිල්. (කැලණිය)*

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩිනලි ෆර්නැන්ඩු**
*බීඒ. (කැලණිය), එම්ඒ. (එංගලන්තය)*

# Reviewers

**Emeritus Professor R. M. W. Rajapaksha**
*BA., MA.(Kelaniya), MA.(York), PhD. (London)*

**Senior Professor Anura Manatunga**
*BA.(Kelaniya), MA.(Poona), MSc. (Kelaniya), FSLCA*

**Professor K. B. Jayawardhane**
*BA. (Kelaniya), MA., PhD. (BHU, India)*

**Rev. Professor Induragare Dhammarathana Thero**
*BA., MA. (Kelaniya), PhD. (Pune), Royal Pandith*

**Rev. Professor Malvane Chandraratana Thero**
*BA., MPhil. (Kelaniya), PhD. (Pune)*

**Professor Swarna Ihalagama**
*BA., MPhil. (Kelaniya), PhD. (Wuhan)*

**Professor Preshanthi Narangoda**
*BA., MSc. (Kelaniya), PhD. (USA)*

**Rev. Dr. Kapugollawe Anandakiththi Thero**
*BA. (Kelaniya), MA., PhD. (Pune)*

**Dr. Kalyani Wejesundara**
*BA. (Colombo) MA., PhD. (Kelaniya)*

**Dr. Vindhya Weerawardhana**
*BA., MA., MPhil., PhD. (Kelaniya)*

**Senior Lecturer Lanka De Silva**
*BA. (Kelaniya), MSc. (Moratuwa)*

**Senior Lecturer Neel Pushpakumara**
*BA., MA. (Peradeniya), MA., MPhil. (Kelaniya)*

**Dinali Fernando**
*BA. (Kelaniya), MA. (Reading, UK)*

# පටුන

**පාලි-සිංහල සාහිත්‍යාගත මේඝය සහ කාලිදාසකෘත**
**මේඝදූත ඛණ්ඩකාව්‍යාවධානී ව සංස්කෘත සාහිත්‍ය කවුළුවෙන්**
**මේඝ සංකල්පාවලෝකනය**
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ 17

**Anumiti Vāda, Vyaktiviveka and Anumiti**
**concept in Sinhala Literary Criticism**
Prof. Bihesh Indika Sampath 51

**Music Iconography Portrayed in South Asian Buddhist Arts**
**(based on Ajanta Buddhist caves)**
Chandana Ruwan Kumara 74

**An analytical approach of the accurate measuring scale of**
**principal measuring unit of Vaḍuriyana**
Rev. Udawela Rewatha Thero 89

**සමාජ වෘත්තවේදය තුළ සෞන්දර්ය කලා භාවිතය :**
**සංකල්පීය න්‍යායික ක්‍රමවේද සහ ප්‍රවේශ පිළිබඳ**
**සංසන්දනාත්මක විශ්ලේෂණයක්**
ආචාර්ය ජගත් බණ්ඩාර පතිරගේ 109

**A Comparative Study of the Acquisition Patterns of Prepositions: Adult Sinhala Speaking Undergraduate Students of Learning English as a Second Language in four Academic Years**
Dr. Ramani Rathnamali Jayasinghe 137

**සීගිරි පද්‍යවල අන්තර්ගත ත්‍රෛකාලික ක්‍රියාපද පිළිබඳ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක්**
ඉන්දික මුණවීර 159

**වාස්තුශාස්ත්‍රාගත මූලික ප්‍රමිති මානයන්හි විද්‍යමාන අංගුලයක පරිමාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්**
ඒ. එම්. ජී. ආර්. මධුශානි 187

The Journal of the Faculty of Humanities (JHU) (2025), Volume 33, Issue 1, 17-50
ISSN 1391-5096 (Print), ISSN 2783 – 8951 (Online)

# පාලි-සිංහල සාහිත්‍යගත මේඝය සහ කාලිදාසකෘත මේඝදූත ඛණ්ඩකාව්‍යාවධානී ව සංස්කෘත සාහිත්‍ය කවුළුවෙන් මේඝ සංකල්පාවලෝකනය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ

## Abstract

The term 'Mēghā' (cloud) is used exclusively in the three languages of Sanskrit, Pāli, and Sinhala to refer to the concept of rainclouds. For instance, words such as 'Varivāha,' 'Jaladharā,' 'Ambubhṛt,' 'Thōyada,' and 'Payodharā' can be considered. According to lexical sources relevant to these languages, the definition of 'Mēghā' is provided along with a set of technical terms. The creative works impregnated with the concept of 'Mēghā' are prominent in these three languages. In the field of musicology, 'Mēghā' also appears as a rāga. The religious expression of the 'Mēghā' concept is encountered in Pāli literature. Within the Tripitaka literature, 'Mēghā' has been frequently used as a religious conceptual term. In both Sinhala and Sanskrit literature, the concept of 'Mēghā' has been largely associated with aesthetic expressions. The usage of 'Mēghā' and its technical terms in these languages appears to be highly metaphorical. Whilst Sinhala poet directs attention towards

the birds, in the context of Sinhala Sandēśa poetry, Sanskrit poet's greater focus was directed towards the concept of the cloud. The Sinhala poetic concept of 'Mēghā' can be seen in classical Sinhala literature, Colombo literature, modern poetry, and lyrics, often symbolizing clouds which are not necessarily related to rain. In this case, the Vēdik understanding of the 'Mēghā' concept is largely influenced by the Ṛgveda. In Sanskrit literature, the most notable expression of the 'Mēghā' concept is found in Kālidāsa's *Meghāduta* (Cloud Messenger). The humanized representation of the cloud in this work is often discussed in detail. *Meghāduta* can also be identified as a precursor to the genre of *duta*-kāvya (messenger poetry). The concept of 'Mēghā' transcends specific geographical, temporal, and linguistic boundaries, making it a timeless concept. Scholars continue to explore further research avenues regarding this concept.

**Keywords:** *Dūtakāvya, Megha, Kālidāsa, Meghadūta, Ṛgveda*

## හැඳින්වීම

ඍග්වේද - යජුර්වේද - සාමවේද - අථර්වවේද යන චතුස්සංහිතා යනු අතීත භාරතීයයන්ගේ ඥාන සංචිතය යි. ඍග්වේද සංහිතාවේ දෘශ්‍යමාන පර්ජන්‍ය යනු දේවත්වාරෝපිත මේඝය යි. පාලි භාෂා සාහිත්‍යය ද ආගමික දෘෂ්ටි කෝණයෙන් මේඝය භාවිතයට ගනියි. සිංහල භාෂා සාහිත්‍යයික ප්‍රවණතාව වන්නේ සෞන්දර්යාත්මක දෘෂ්ටියෙන් මේඝය අවලෝකනය කිරීම යි. මේ අතර මේඝ සංකල්පය පිළිබඳ සංස්කෘත සාහිත්‍යාගත උපරි ප්‍රකාශනය වශයෙන් අපට හඳුනා ගැන්මට ලැබෙන්නේ කාලිදාසයන්ගේ මේඝදූතය යි.

මේඝ යනු සංස්කෘත, පාළි සහ සිංහල යන භාෂා ත්‍රයේ ම වැසිවලාකුළ උදෙසා භාවිත වචනයකි. '**මේහති සිඤ්චති යඃ**'[1] යන ශබ්දකල්පද්‍රුමාගත විග්‍රහ වාක්‍යයට අනුව දිය වැක්කිරීම, දියෙන් තෙමීම සිදුකරන්නේ යමක් ද යමෙක් ද ඒ මේඝය යි. තත් කෝශ

1. ශබ්දකල්පද්‍රුමඃ තෘතීය කාණ්ඩය; රාජා රාධා කාන්තදේව, කල්කටා, 1886, 776 පිටුව.

ග්‍රන්ථය ශබ්දරත්නාවලී, රත්නමාලා, ත්‍රිකාණ්ඩශේෂ, අමරකෝශ ආදි කෝශ ග්‍රන්ථ ආශ්‍රයෙන් **වාරිවාහ, ධාරාධර, ජලධර, ජලද, වාරිද, අම්බුභෘත්, ජලමුච්, පයෝධර, අම්භෝධර, නීරද, අම්බුද, තෝයද, අම්බුවාහ, වාරිමසි** ආදි කොට ඇති, මේඝය උදෙසා භාවිත කැරෙන වචන සමුදායක් අප අබිමුව තබයි. **වලාහක, ජීමූත, ශ්වේතනීල, ධූමයෝනි, මුදිර, ව්‍යෝමධූම, ඝනාඝන, වායුදාරු, නභස්චර, කන්දර, ගගනධ්වජ, නභෝගජ, ගදාම්බර** යන වචන භාවිත කොට ඇත්තේ ජලය නොදරන වලාකුළ හැඳින්වීම සඳහා ය. මේඝය හෙවත් වැහි වලාකුළ උදෙසා භාවිත සෑම නමක් සමග ම ජලාර්ථවාචී **වාරි, ධාරා, ජල, අම්බු, පයස්, තෝය** ආදි වචන යොදා තිබීමෙන් පැහැදිලි වන්නේ එය යි.[2]

කාලිදාස කවියා තුළ වැහිවලාකුළ උදෙසා පමණක් **මේඝ** යන්න භාවිත කළ යුතු බව සහ වැසි නොවස්වන වලාකුළු උදෙසා ඒ නම භාවිත කළ නොහැකි ය යන අවබෝධය විය. ඔහුගේ **මේඝදූතය** වලාහකදූතය, වායුදාරුදූතය, නභස්චරදූතය බඳු නමක් නොලබන්නේ එහෙයිනි. මේ අතර **ශබ්දකල්පද්‍රුමය** මේඝප්‍රතිබද්ධ පද්‍ය රාශියක් විවිධ සංස්කෘත මූලාශ්‍රයන්ගෙන් උපුටා දක්වයි. එහි එක පද්‍යයක බහුරූපවත් වූ ඝෝර ස්වරූප ඇති ගොරබිරම් හඬ ඇති වැහිවලාකුළ අහස් ගැබ පිරවූ බව සඳහන් ය.[3] තවත් පද්‍යයක මහා ඕඝයක් මෙන් මේඝය වර්ෂණය කරමින් ඝෝර වූ අයහපත් වූ සියලු ගිනි නසන බව කියැවෙයි.

> **"තතස්තේ ජලදා වර්ෂං වර්ෂන්තීහ මහෞඝවත් -**
> **සුඝෝරමශිවං සර්වං නාශයන්ති ච පාවකම්"**[4]

අග්නිය නැසුණු කල්හි වසර සියගණනක් පුරා රැස්වුණු මහාජලපරිශ්‍රවය කරණ කොට ගෙන ජලය ම සම්භවය කොට ඇති වලාකුළු ය, මහපොළොව මත පැතිර යන්නේ.[5] වැසි වලාකුළේ මෙහෙවර වන්නේ සියලු ජීවීන්ගේ හිතසුව පිණිස හාත්පස හැසිරීම යි. **'සර්වභූතහිතාර්ථාය...වර්ෂති'**[6] යන වචන රැගත් පද්‍යයේ සමුදයාර්ථය

2. එම.
3. එම.
4. එම.
5. එම.
6. එම.

වන්නේ එය යි. වැසි වලාකුළෙහි උත්පත්තිය **අග්නිජා, බ්‍රහ්මජා** සහ **පක්ෂජා** වශයෙන් ත්‍රිවිධාකාර ය.[7] එම මූලාශ්‍රයට අනුව වලාකුළ ගින්නෙන් ද බ්‍රහ්මගෙන් ද පක්ෂයෙන් ද වෙන වෙන ම හට ගනියි. වලාකුළු, ජලය ඒ ඒ තැන්වලට ප්‍රදානය කරමින් ඒ ජලය රඳවා ගන්නා ස්ථානය අනුව විවිධ ස්වරූප ගන්වයි. නදියකට වැටෙන ජලය නදී ස්වරූපය ද වැවකට වැටෙන ජලය වැවේ ස්වරූපය ද ගන්නා පරිද්දෙනි. **'අනේකරූපසංස්ථානාඃ පූරයන්ති මහීං ජලෛඃ'**[8] යන කාව්‍යෝක්තියේ අර්ථය එය යි.

සංගීතශාස්ත්‍ර දෘෂ්ටිකෝණයෙන් බලන කල ද මේඝයට සුවිශේෂ ස්ථානයක් හිමි වෙයි. මේඝරාග යනු ප්‍රචලිත රාගයකි. **'ෂඩ්රාගාන්තරගතරාගවිශේෂඃ'** යනුවෙන් ප්‍රකාශිත රාග අතරට එය ද අයත් ය. **භෛරවී, වසන්ත, නට, නාරායණ, ශ්‍රීරාග** සහ **මේඝරාජ**[9] යනු එහි සඳහන් ෂඩ්රාග යි. **'බ්‍රහ්මණෝ මස්තකාත් නිර්ගතඃ'** යන පාඨයෙන් කියැවෙන පරිදි මේ ෂඩ්රාග පැමිණ ඇත්තේ බ්‍රහ්මමස්තකයෙනි. එසේ ම මෙම රාග අහසින් උපන් බවත් වැසි වසින රාත්‍ර්‍යවසානයේ එනම් ඒ උදෑසන ඒවායේ ගාන සමය වන බවත් එහි සඳහන් ය.[10] **ශබ්දකල්පද්‍රැමයේ** භෛරව, කෞශික, හින්දෝල, දීපක, ශ්‍රී රාග සහ මේඝරාජ යනුවෙන් ෂඩ්රාග ගැන සඳහන් සංගීතදර්පණාගත පද්‍යය ද ඇත.[11] ලෝචනකවිගේ **රාගතරංගිණියෙහි** භෛරවී, තෝඩී, කර්ණාට, කේදාර, යමන්, සාරංග ආදි කොට ඇති මූල රාග දොළොසට **මේඝ රාගය** ද අයත් ය.[12]

## සාහිත්‍ය විමර්ශනය

මේඝය පිළිබඳ වන නිර්වචන සහ විග්‍රහ ගවේෂණයේ දී **ශබ්දකල්පද්‍රැමය** වෙසෙසින් වැදගත් වෙයි. රාජා රාධා කාන්තදේව විසින් සම්පාදිත **ශබ්දකල්පද්‍රැමයේ** තෘතීය කාණ්ඩයේ 776-778

7. එම.
8. එම.
9. එම.
10. එම; 776, 777 පිටු.
11. එම; 777 පිටුව.
12. අභයසුන්දර; විමල්ඃ සංගීත සංහිතා, කොළඹ, 1963, 174, 175 පිටු.

පෘෂ්ඨත්‍රයේ තන්නිරුක්ති සහ විග්‍රහ විද්‍යමාන ය. **අමරකෝශ, ශබ්දරත්නාවලී, රත්නමාලා, ත්‍රිකාණ්ඩශේෂ** යන කෝශ ග්‍රන්ථයන්ගෙන් ගත් මේඝ පාරිභාෂික පද ද **ශබ්දකල්පද්‍රැමයේ** අන්තර්ගත ය. එසේ ම මේඝ භාවිත සංස්කෘත සාහිත්‍ය ග්‍රන්ථ රාශියක උද්ධෘත ද එහි දෘශ්‍යමාන ය. **ජ්‍යෝතිතන්ත්‍ර, කූර්මපුරාණ, බ්‍රහ්මාණ්ඩපුරාණ, කල්කිපුරාණ, සංගීතශාස්ත්‍ර, සංගීතදර්පණ, හාරාවලී, ශබ්දචන්ද්‍රිකා, ශබ්දමාලා, රාමායණ, මහාභාරත, උත්තරරාමචරිත, ශිශුපාලවධ, භාවප්‍රකාශ** ආදි ග්‍රන්ථාන්තරයන්ගෙන් ගත් මේඝ සාංකල්පික උද්ධෘත ඊට නිදර්ශන යි.

මේඝය පිළිබඳ පාරිභාෂික වචන ගවේෂණයෙහිලා **ශ්‍රී සෝරත නාහිමියන්ගේ ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, හරිශ්චන්ද්‍ර විජයතුංගගේ මහා සිංහල ශබ්දකෝෂය, සිංහල නාමාවලිය, චාල්ස් කාටර්ගේ A Sinhalese – English Dictionary, ජේ. බී. දිසානායකගේ Encyclopadia of Sinhala Language and Culture** යන ග්‍රන්ථ වැදගත් විය. පාලි සාහිත්‍යාගත ව මේඝ සංකල්පය අධ්‍යයනය කිරීමේ දී **ථෙර-ථෙරීගාථා, සංයුත්ත නිකායගත මේඝසූත්‍ර, අංගුත්තර නිකායගත ඇතැම් සූත්‍ර, ඉතිවුත්තක පාළිය, සුත්තනිපාත, අපදානපාළි, ජාතකපාළිය** තත් සංකල්පය අන්තර්ගත පූර්ව සාහිත්‍ය මූලාශ්‍රය වශයෙන් හඳුනාගත හැකි විය. සංගීත දෘෂ්ටි කෝණයෙන් මේඝය අවලෝකනය කරන විට විමල් අභයසුන්දරගේ **සංගීත සංහිතා** ග්‍රන්ථයේ ඇති උපයෝගීතාව ද පෙනී ගියේ ය.

එස්. පරණවිතානගේ **Sigiri Graffiti** ග්‍රන්ථයත් සම්මානිත මහාචාර්ය පී.බී. මීගස්කුඹුර ලේඛනාවලී ග්‍රන්ථයත් වැදගත් වූයේ ඒවායේ දක්නට ලැබෙන මේඝ සංකල්පය පිළිබඳ සදෘශ මෙන් ම විසදෘශ අදහස් තත් සංකල්පය පිළිබඳ වෙනත් අවලෝකනවලට ද ඉඩ සැලසූ බැවිනි. එසේ ම තත් සංකල්පාගත පූර්ව නිර්මාණ අධ්‍යයනයේ දී අපට හංස සන්දේශය මෙන් ම සැළලිහිණි සන්දේශය ද උපකාරී විය. කොළඹ කවිය ආශ්‍රයෙන් මේඝය පිළිබඳ වන අධ්‍යයනයේ දී එච්. ඇම්. කුඩලිගමගේ **කුණාටුව** සහ ඈ යන කාව්‍ය ග්‍රන්ථ දෙකත් විමලරත්න කුමාරගම කවියාගේ නිර්මාණ ඇතුළත් පී. බී. අල්විස් පෙරේරා විසින් සංගෘහීත විමලරත්න කුමාරගම ග්‍රන්ථයත් භාවිතයට ගන්නා ලදී. පශ්චාත් නූතන කවිය ආශ්‍රයෙන් තත් සංකල්පය විවරණය කිරීමේ දී භාවිත කරන ලද්දේ කණිෂ්ක

මහේන්ද්‍ර විජයරත්නගේ වැස්ස **ඉන්නෙත් උණ අරන්** සහ ලක්ශාන්ත අතුකෝරලගේ **අමාවකේ සඳක් සිඹිමි** යන කාව්‍ය ග්‍රන්ථ ද්වය යි. ගීතාශ්‍රිත ව මේඝ සංකල්පය අධ්‍යයනය කිරීමෙහි ලා **මහගම සේකර හංස ගීතය සහ තවත් නිර්මාණ, මහගම සේකරගේ ගීත, මහගම සේකර නොපළ ගීත** යන ග්‍රන්ථ ත්‍රය ද සුනිල් ආරියරත්නගේ **අරුන්දතී, මකරන්ද, ළා හිරු දහසක්** සහ **තුටු පඬුරු** යන ගීත සංග්‍රහ චතුර්ථය ද රත්න ශ්‍රී විජේසිංහගේ **වංකගිරිය අරණේ, සුදු නෙළුම, ආලකමන්දා, නිකිණි වැස්ස** යන ගීත සංග්‍රහ චතුර්ථය ද භාවිතයට ගන්නා ලදී.

මේඝ සංකල්පයේ පූර්ව දෘශ්‍යමාන ගවේෂණයෙහි ලා **ඍග්වේද සංහිතාව, ඍග්වේද ගීතාවලී, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාග මේ ශාස්ත්‍රීය සංග්‍රහය 1999** සහ **ආතර් ඇන්තනී මැක්ඩොනල්ගේ A Vedic Reader For Students** යන ග්‍රන්ථ භාවිත කැරිණ. මේඝදූතයට අමතර වශයෙන් ලෞකික සංස්කෘත සාහිත්‍ය මූලාශ්‍රය ඔස්සේ මේඝ සංකල්පය විවරණය කිරීමෙහි ලා භාවිතයට ගන්නා ලද්දේ **රාමායණය, ඍතුසංහාරය, ජානකීහරණය, දශකුමාරචරිතය** සහ **ගීතගෝවින්දය** යි. **මේඝදූතය** මෙහි ප්‍රධාන මූලාශ්‍රයක් වූ බැවින් එම්. ආර්. කාලේ විසින් සම්පාදිත **The Meghaduta of Kalidasa, with the Commentary (Sanjivani) of Mallinatha** නම් ග්‍රන්ථයත් වටගෙදර විමලබුද්ධි හිමියන් විසින් සම්පාදිත **මහාකවිකාලිදාසවිරචිතමේඝදූත විස්තරාර්ථ සහිත පදගත සන්නයත්** වෙසෙසින් භාවිතයට ගනු ලැබිණ.

## පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක එළඹුමකින් යුක්ත මෙම පර්යේෂණයේ ප්‍රධාන වශයෙන් විශ්ලේෂණාත්මක ක්‍රමවේදය භාවිත කැරිණ. පර්යේෂණ ක්‍රමවිධි වශයෙන් තේමාත්මක විශ්ලේෂණයත් පඨිත විශ්ලේෂණයත් තුලනාත්මක විශ්ලේෂණයත් භාවිත ය. පර්යේෂණයේ උද්ගාමී තර්කනය හෙවත් පහළ සිට ඉහළට තර්ක කිරීමත් නිගාමී තර්කනය හෙවත් ඉහළ සිට පහළට තර්ක ගොඩනැගීමත් සිදු විය. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිත කරන ලද අතර ආනුභවික නිරීක්ෂණ ද යොදාගන්නා ලදි.

# ප්‍රතිඵල හා සාකච්ඡාව

## 01. පාලි භාෂා සාහිත්‍යාගත මේඝය ප්‍රතිබද්ධ සංක්ෂිප්ත විග්‍රහය

පාලි භාෂා සාහිත්‍යයේ වර්ෂාව උදෙසා වන බහුල භාවිතය වන්නේ **දේව** යි. එය අහස, වැස්ස, දේවතාවා හෙවත් දෙවියා, රජ යන අරුත්වල ද යෙදේ. **වස්සති දේවෝ යථා සුගීතං - වැස්ස සොඳුරු ගීතයක් සේ වසියි**[13] යන ථේරගාථා පාඨය ඊට නිදසුනි. සංයුත්ත නිකායගත මේඝසූත්‍ර ද[14] අංගුත්තර නිකාය ද අපට මේඝය සම්මුඛ කරවයි. අංගුත්තර නිකායේ සූත්‍රයකට අනුව ගල්මුදුනෙක දළ පොද ඇති මේඝයක් වස්නා කල, ඒ දිය නිම්න තිබූ සේ පෙරළෙමින් අවුත් පර්වත කන්දර පදර ශාඛා පුරවයි. අනතුරුව ගල්කඳුර පැළී ඇලි පිරෙයි. ඒවා කුඩා හෙප් පුරවන අතර එසේ පිරුණු කුඩා හෙප් මහ හෙප් පුරවාලයි. මහහෙප් කුඩා නදීන් ද කුඩා නදීහු මහා නදීන් ද පුරවති. ඒ මහා නදීහු සමුදුර පුරවති. **උපරිපබ්බතේ ථුල්ලඵුසිතකේ දේවේ වස්සන්තේ** වශයෙන් ආරබ්ධ එම පාලි පාඨය සෞන්දර්යාත්මක මේඝ යෝජනයකට නිදසුනි.[15]

අංගුත්තර නිකායේ වලාහක වග්ගයේ පඨමවලාහක සූත්‍රය සහ දුතියවලාහක සූත්‍රය වශයෙන් සූත්‍ර දෙකකි. තන්නිකාය වැසි වලාකුළු පිළිබඳ පාලි සාහිත්‍යාගත බෞද්ධ සමාජයේ ප්‍රචලිත ප්‍රකාශයක් මුණ ගස්වයි.

> **"ගජ්ජිතා නෝ වස්සිතා වස්සිතා නෝ ගජ්ජිතා නෙව ගජ්ජිතා නෝ වස්සිතා ගජ්ජිතා ච වස්සිතා."**[16]

---

13. ථේර-ථේරීගාථා පාළි: 1. 6. 1 - 4, 5. 1. 3 පරි: කරහම්පිටිගොඩ සුමනසාර හිමි; බුද්දකනිකාය; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 28; බණ්ඩාරගම, 2005, 24, 106 පිටු.
14. සංයුත්ත නිකාය පඤ්චම භාගය (1) 1.14 29-32, 33-36 මේඝසූත්‍ර; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා -17; බණ්ඩාරගම, 2006, 114-117 පිටු.
15. අංගුත්තර නිකාය ප්‍රථම භාගය: 3. 2. 5. 4 සූත්‍රය; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා - 18; බණ්ඩාරගම, 2006, 432, 433 පිටු.
16. අංගුත්තර නිකාය; ද්විතීය භාගය: 4. 3. 1. 1 පඨමවලාහක සූත්‍රය සහ 4. 3. 1. 2 දුතියවලාහක සූත්‍රය 4. 3. 1. 2 බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 19; බණ්ඩාරගම, 2006, 196 - 201 පිටු.

ඇතැම් වලාකුළක් ගර්ජනය කරන නමුදු වැසි වැස්වීමට අසමත් ය. ඇතැම් වලාකුළක් වැසි වස්වන මුත් ගර්ජනා නොකරයි. තවත් වලාකුළක් ගර්ජනය නොකරයි, වැසි ද නොවස්වයි. තවත් වලාකුළක් ගර්ජනය කරන අතර වැසි ද වස්වයි. මෙය වලාකුළක ස්වභාව ප්‍රකාශනයකි; මානව චරණ පිළිබඳ ගැඹුරු විග්‍රහයකි.

ඛුද්දකනිකායේ ඉතිවුත්තක පාලියේ එන **වුට්ඨි සූත්‍රයේ** අන්තර්ගත බුද්ධ දේශනාවට අනුව මෙලොව ජීවමාන පුද්ගල චරිත ත්‍රයකි. ඒ **අවුට්ඨිකසම, පදේසවස්සී** සහ **සබ්බත්ථාභිවස්සී** ය. අවුට්ඨිකසම යනු නොවස්නා වැහි වළාවක් බඳු පුද්ගලයා ය. පදේසවස්සී හෙවත් ප්‍රදේශවර්ෂී යනු කිසියම් ප්‍රදේශයකට පමණක් වැසි වස්වන කෙනා ය. සබ්බත්ථාභිවස්සී හෙවත් සර්වත්‍රාභිවර්ෂී යනු හැමතන්හී වස්නා වලාවක් බඳු පුද්ගලයා ය.[17] සුත්තනිපාතාගත ධනිය සූත්‍රයේ එන ධනිය ගෝපාල නම් ධනවතා මේඝයට අභියෝග කරමින් පවසන්නේ, තමා සිදු කළ බත් කිස ඇති හෙයින් ද දෝනා ලද කිරි ඇති හෙයින් ද මිහි ගංතෙර සිය අනුචරයන් සමග වාසය ඇති හෙයින් ද ගිනි දල්වා ඇති හෙයින් ද සිය වාසගෘහය සෙවෙණි කරන ලද හෙයින් ද කැමති නම් වසින ලෙස ය.[18] මෙයට පිළිතුරු දෙමින් බුදු රජාණන් වහන්සේ මේඝයට, තමා නොකිපෙන ස්වභාව ඇති බැවින් ද පහව ගිය හුල් ඇති බැවින් ද මිහිගංතෙර ඒකරත්තිවාස බැවින් ද හදකුටියේ කෙලෙස් නැති බැවින් ද විවෘත වූ බැවින් ද අග්නිය සන්සිඳුණු බැවින් ද **මේඝය කැමති නම් වසින්න** යන අර්ථය දෙන **අථ චෙ පත්ථයසි පවස්ස දේව**[19] යන වචන වදාරති. මේ බුද්ධ වචනය යි.

ථෙර ථෙරී ගාථා පාළියේ සුභූති ථෙර ගාථාවෙහි සිය ජීවිතය නමැති කුටිය සංවෘත බැවින් වා පීඩා නොමැති බැවින් හිත සුසමාහිත බැවින් වෙසෙසින් මිදුණ බැවින් වෙරවත් බැවින් කිසිවකට බාධා කළ නොහැකි බව කියැවෙයි. එහෙයින් උන් වහන්සේ රිසි සේ

17. ඉතිවුත්තකපාළිඃ 3.3.6 වුට්ඨි සූත්‍රය, ඛුද්දකනිකාය ප්‍රථම භාගයඃ බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා - 24; බණ්ඩාරගම, 2006, 406 - 409 පිටු.

18. සුත්ත නිපාතය 1. 2 ධනිය සූත්‍රය; පරිඃ පරවාහැර සිරි පඤ්ඤානන්ද හිමි; ඛුද්දකනිකාය ප්‍රථම භාගයඃ බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා - 25; බණ්ඩාරගම, 2006, 6 පිටුව.

19. එම; එම 6-11 පිටු.

වසින්නැයි මේඝයට පවසති.[20] එසේ ම උපාලි ස්ථවිර අපදානයේ මේඝය වර්ෂණය කරයි යන අර්ථය දෙන **මේඝෝ පවස්සති**[21] යන යෙදුම හමු වෙයි. ජාතකපාළි මූලාශ්‍රයේ මේඝය ගර්ජනා කරව යන අර්ථය දෙන **අභිත්ථනය පජ්ජුන්න**[22] යන ප්‍රකාශය මච්ඡ ජාතකයේ අන්තර්ගත ය. වෙස්සන්තර ජාතකයේ වනවාසී ජීවිතයක් උදෙසා වන අරණ වෙත යන වෙසතුරු රජු අමතා චේතවාසීන් පවසන්නේ ඔබට නිල් වලාකුළක් බඳු නිරතුරු පලාවන් ගණබිම් ඇති මල් රුකින් යුත් පල රුකින් යුත් වන ලැහැබට ගොදුරු කැමැති සිංහයකු මෙන් පිවිසෙන ලෙස යි. **සෝ වනං මේඝසංකාසං ධුවං හරිතසද්දලං**[23] ආදි වශයෙන් ආරබ්ධ ගද්‍ය පාඨයේ අර්ථය එය යි.

## 02. සිංහල භාෂා සාහිත්‍යාගත මේඝය හැඳින්වීම සහ සම්භාව්‍ය සාහිත්‍යයික මේඝ ප්‍රකාශන

ශ්‍රී සුමංගල ශබ්දකෝෂයේ වැසි වලාකුළ උදෙසා **පයෝධර, මෙග,** සහ **මේඝ** යන වචන භාවිත ය. මේඝනාමපූර්වක **මේඝාගම, මේඝකාල, මේඝකූට, මේඝගර්ජනා, මේඝධ්වනි, මේඝනාද, මේඝපටල මේඝපාද, මේඝමාරුත, මේඝමාලා, මේඝමුඛ, මේඝරාජි, මේඝවර්ෂ, මේඝවිවර, මේඝශිර්ෂ, මේඝශ්‍රේණි**[24] යන වචන ද එහි දෘශ්‍යමාන ය. තච්ඡබ්දකෝශය යථෝක්ත වචන දක්වන්නේ ඒවා යෙදුණු ධර්මප්‍රදීපිකාව, බුත්සරණ, මුවදෙව්දාවත, ස්තූපවංශය, සද්ධර්මරත්නාවලී, දළදා සිරිත යනාදි සම්භාව්‍ය සිංහල ග්‍රන්ථවල අදාළ පෘෂ්ඨාංක ද උපුටා දක්වමිනි. විදේශයකින් මෙරටට පැමිණ සිංහල භාෂා සාහිත්‍යය හදාළ කාටර් පියතුමා ද වලාකුළ හා බැඳුණු

20. ථෙර-ථෙරී ගාථාපාළි: 1. 1. 1 පරි: කරහම්පිටිගොඩ සුමනසාර හිමි; ඛුද්දකනිකාය; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 28-29; බණ්ඩාරගම 2006, 2 පිටුව.
21. අපදාන පාළි- ථෙර අපදාන ප්‍රථම භාගය 6. උපාලි ථෙරාපදානය පරි: තලල්ලේ ධම්මානන්ද හිමි; ඛුද්දකනිකාය; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 36; බණ්ඩාරගම, 2006, 74 පිටුව.
22. ජාතක පාළි: ප්‍රථම භාගය; මච්ඡ ජාතකය, අනු මඩිහේ සිරි පඤ්ඤාසීහ නාහිමි; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 30; බණ්ඩාරගම, 2006, 30 පිටුව.
23. ජාතක පාළි: තෘතීය භාගය; වෙස්සන්තර ජාතකය, අනු මඩිහේ සිරි පඤ්ඤාසීහ නාහිමි; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 32; බණ්ඩාරගම, 2006, 396 පිටුව.
24. ශ්‍රී සුමංගල ශබ්දකෝෂය (සිංහල-සිංහලාර්ථ) ද්විතීය භාගය; වැලිවිටියේ ශ්‍රී සෝරත ස්වාමීන්ද්‍රයන් වහන්සේ, කොළඹ, 1970, 556, 797, 797 පිටු.

වචන රාශියක් වෙත සිය අවධානය යොමු කරයි. **මේකුළ, මේඝ අඳුර, මේඝකාල, මේඝ ගර්ජනය, මේඝ චින්තකයා, මේඝ ධාරාව, මේඝ පාදය, මේඝ ධ්වනිය, මේඝ පුෂ්පය, මේඝ භූතිය, මේඝ රාවය**[25] බඳු වචන රාශියක් යථෝක්ත ශබ්දකෝශයේ අන්තර්ගත ය. මෙහි භාවිත **මේඝ චින්තක** කාටර් ඉංග්‍රීසියට පරිවර්තනය කරන්නේ thinker of rain or rain disirer වශයෙනි.[26] ඒ පිළිබඳ සාවධාන වද්දී අපට සිහිපත් වන්නේ මේඝ චින්තකයකු වූ භාරතීය සාහිත්‍යධර රබීන්ද්‍රනාත් තාගෝර් ය. මන්ද තාගෝර් යනු මේඝප්‍රිය, වර්ෂා කාලය ගැන ගීත මෙන් ම කාව්‍ය රචනා කළ මේඝ චින්තකයකු බැවිනි.

මහා සිංහල ශබ්දකෝෂයේ මේඝය උදෙසා භාවිත වචන අතර පිළිවෙළින් **අම්බුද, අම්බුධර, අඹක, ජලධර, නීරද, පයෝධර, මෙ කුළ, මේ, මේකුළු** සහ **මේඝ**[27] යන ඒවා ද වෙයි. තව ද සිංහලයේ වලාකුළ යන අර්ථය දෙන **මේ** යන්න මුලින් දී අපර පද එක්වීමෙන් සැදෙන වදන් කිහිපයක් තිබේ. ඒ අනුව මේ කල් යනු මේඝ කාලය යි; මේ කැල යනු වලාකුළු සමූහය යි; මේ ගජ යනු මේඝය නමැති හස්තියා ය; මේකුළ යනු වලාකුළ යි; මේගබ් යනු මේඝ ගර්භය යි. මේ ගැජුම් යනු මේඝ ගර්ජනය යි; මේගිරි වෙහෙර යනු මේඝගිරි විහාරය යි; මේගොස් යනු මේඝ ඝෝෂාව යි; මේතුටු යනු මේඝයට තුටු වන්නා එනම් මොනරා යි; මේරජ යනු දික් වූ වලාකුළ හෙවත් මහවලාකුළ යි; මේ වන් යනු මේඝ වර්ණය එනම් නීල වර්ණය යි.

මේ අතර සිංහල නාමාවලිය දෙව්පියවුරු, මේ වලා, මේග ආදි නම් සමග අපට මේඝය සම්මුඛ කරන්නේ වෙයි.

> **"පොද දියබිඳු නම් වේ දනු වැසි පොදට-**
> **නිලි නම් වේ මේගෙනුපන් ගනඳුරට**
> **තුසර නිහර පිනි හිම නම් දනු හිමට -**
> **සිසර සිහිල් ඇල් හිම නම් වෙ සිසිලට"**[28]

25. A Sinhalese – English Dictionary by Charles Carter, Colombo, 1965, 512, 513 pp
26. Ibid; 512 p.
27. ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය; සම් හරිශ්චන්ද්‍ර විජයතුංග, කොළඹ, 2015, 135,137,754,1047,1408,1413,1414 පිටු.
28. සිංහල නාමාවලිය සය වන පරාක්‍රමබාහු මහරජතුමාගේ අමාත්‍ය නල්ලූර්තුනයා විසින් විරචිතයි. එච්. වී. ජී. සෝමසිරි ජයවර්ධන; කොළඹ, 2004, 20, 21 පිටු.

සිංහල කවීන් සහ සංස්කෘත කවීන් සිය සන්දේශ යැවීම සඳහා දූතයන් තෝරා ගැනීමේ දී කටයුතු කොට ඇති ආකාරයේ වෙනස ගැන ජේ.බී. දිසානායක විද්වතා කතා කරයි. ඒ සිංහල කවියා සිය දූතයන් වශයෙන් පක්ෂීන් යොදා ගැනීමෙන් සහ සංස්කෘත කවියා මේඝය බඳු සොබාදහමේ දෘශ්‍යමාන වස්තුවක් තෝරා ගත් බව කීමෙනි.[29] එහෙත් පසුකාලීන ව සංස්කෘත කවියා ද සිංහල කවීන් මෙන් ම සිය සන්දේශහරණයෙහි ලා පක්ෂීන් තෝරා ගැන්මේ ප්‍රවණතාවට යොමු ව තිබේ. රූපගෝස්වාමිගේ **හංසදූතය** සහ කර්තෘ අවිනිශ්චිත **පිකදූතය** ඊට නිදර්ශන යි.

සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ මේඝය හෙවත් වලාකුළ ගැන කියැවෙන තැන් රැසකි. පී. බී. මීගස්කුඹුර විද්වතා කව්සිළුමිණේ 9 වැනි සර්ගයේ එන අදහස් ද හකුලා දක්වමින් පවසන්නේ භාරතීය කාව්‍යවල මේඝ ඍතුව (මේ කල්) ගැන ඇති වර්ණනා බොහෝවිට සෞභාග්‍යය, සමෘද්ධිමත් භාවයේ සංකේත බව යි. ප්‍රේම සංගම සිදු වන මෙම කාලය වැසි වලාබර අහස, දලුලන රුක්ලිය, අහස පුරා සිටින කොක් රැන්, බිඟුන් ගැවසි නියඟලා මල්, ගස් වසා සිටින කණාමැදිරියන්, පොළොවෙහි ඉදිගොව්වන් ආදි රමණීය පරිසරයේ සජීවී බව පෙන්වන අවධියක් බවත් ගොවීන් සිය ගොවිබිම් සඳහා වැසි අපේක්ෂාවෙන් සිටින කාලයක් බවත් කියයි.[30] සීගිරි ගී අතුරින් ද අපට මේඝය හමු වෙයි. එහි 244 වැනි කවිය ඊට එක් නිදසුනකි. 'මෙය නොදැනුවත්වම දැන් මා ඇස් හමුවට ආ බව කියති. වර්ෂා සමයෙහි (rainy season) පවන් සමග සිහින් වැසි පොද සෙයින් සිතුවිලි එක්ව නැගී ආයේ ය' ආදි අරුත් දෙන පරිදි සෙනරත් පරණවිතාන විසින් ඉංග්‍රීසියට නගා ඇති පරිවර්තනය ඊට නිදර්ශන යි.

**"නොජැනි ම ඇස්හි මෙය් සිත් එක්වන් ආ නු යෙති
මහමෙයැ ගැනැ සෙය්නි ආ සිහිල් පැනිත්තක් පවන්"**[31]

---

29. Encyclopadia of Sinhala Language and Culture J. B. Disanayaka, Colombo, 2017, p 442.
30. සම්මානිත මහාචාර්ය පී.බී. මීගස්කුඹුර ලේඛනාවලීඃ සංසඃ දඹුල්ලේ සුදේව හිමි, පිටතලාවේ විමලසාර හිමි, අපරැක්කේ සිරිසුධම්ම හිමි, දෙහිවල, කොළඹ, 2012, 1081 පිටුව.
31. Sigiri Graffity¦ S. Paranavitana, London, 1956, 149 p.

යථෝක්ත පද්‍යයට කළ එම පරිවර්තනය සමග එකඟ නොවන පී.බී. මීගස්කුඹුර, මෙහ 'මහමෙ' යන්න සැලකිය යුත්තේ වැසි සමය වශයෙන් නොව 'වැහි වලාකුළ' වශයෙන් යැයි කියයි.[32] මන්ද 'වැහි වලාකුළ' මෙහි දී ගැඹුරු අරුතකට ඉඩ සලසන බැවිනි. මාර්ගිකයා සීගිරිය සොයා එන්නේ වැසි වලාකුළක් පාවෙමින් එන ලෙසිනි. සිය ගමනාරම්මණය ඇස ගැටුණු පසු වැහි වලාකුළක් කන්දක හැපුණු විට සීතල වැහි බිඳු පිටතට වැගිරෙන්නාක් මෙන් ඔහුගේ අදහස් පිටාර ගලන්නට වෙයි. ගමන් විඩාවට පත් මිනිසකු සීගිරියට පැමිණීම වැහි වලාකුළක් කන්දක් වෙත පැමිණීම මෙනි.

සම්භාව්‍ය සිංහල සාහිත්‍යයට අයත් සන්දේශ සාහිත්‍යයේ වලාකුළු යෝජන රාශියක් ඇතත් ඒ සියල්ල ම වාගේ නියෝජනය කරන්නේ වලාකුළ මිස වැහි වලාකුළ නොවේ. හංස සන්දේශයේ **නොපටු වලා කුළු, සරද වලා, සඳ වෙල ගිනිදැල්**[33] ඊට නිදසුනි. මෙහි අවසන කී සඳ වෙල ගිනිදැල් යනු සන්ධ්‍යා වලාකුළු නමැති අග්නිජාලාව යි. සැළලිහිණි සන්දේශයේ වැඩි වශයෙන් ඇත්තේ ද වලාකුළ මිස වැහි වලාකුළ නොවේ. එහි එන **සඳ යුරු සඳවෙලෙන් රැඳි රුැසිරු මනරම**[34] යන කාව්‍යෝක්තියේ සරලාර්ථය වන්නේ සන්ධ්‍යා වලාකුළින් රඤ්ජිත වූ සඳ බඳු ආකාර ඇත්තේ යන්න යි. **සැඳෑ වලා පෙළ පැළඳිග පෙනුණු පසු**[35] පද්‍යයෙන් කියැවෙන්නේ ද සන්ධ්‍යා වලාකුළ මිස මේසාර්ථදායී වැසි වලාකුළ නොවේ.

## 03. සිංහල සාහිත්‍යාගත මේඝ සංකල්පය කොළඹ කවි, පශ්චාත් නූතන කවි සහ ගීත

කොළඹ යුගයේ කවීන් අතුරින් වැසි වලාකුළ සිය කාව්‍යයන් රසවත් කරන යෝජනයක් මතු නොව කාව්‍ය සංකේතයක් වශයෙන්

---

32. සම්මානිත මහාචාර්ය පී.බී. මීගස්කුඹුර ලේඛනාවලී: සංස්: දඹුල්ලේ සුදේව හිමි, පිටතලාවේ විමලසාර හිමි, අපරැක්කේ සිරිසුධම්ම හිමි, දෙහිවල, කොළඹ, 2012, 584 පිටුව.
33. හංස සන්දේශය 17, 69, 101 පද්‍ය සම්: ඊ. තෙන්නකෝන්, කොළඹ, 1955, 17, 58, 78 පිටු.
34. ශ්‍රී රාහුල හිමි විරචිත සැළලිහිණි සන්දේශය: 42 පද්‍යය; ශ්‍රී ධර්මාරාම සංශෝධනය; ශ්‍රී ප්‍රඥාසාර සංස්කරණය, කැලණිය, 2018, 84 පිටුව.
35. එම; 50 පද්‍යය; 94 පිටුව.

භාවිතයට ගත් කවීන් අතුරින් එච්. ඇම්. කුඩලිගම කවියාට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. මෙහිලා ඔහුගේ කාව්‍ය නිර්මාණ අතුරින් විශේෂ වන්නේ ඇ සහ **කුණාටුව** යි. **කුණාටුවේ** ප්‍රථම පද්‍යය ඇරඹෙන්නේ **'ගැබිනියකගේ තන පුඩුවල පැහැය උරා - පාවෙන වලාකුළු පවතියි අහස පුරා'**[36] යන කාව්‍යෝක්තියෙනි. පයෝධර යනු ද වලාකුළට නමකි. මේ වූකලී රූපසාම්‍යය මෙන් ම ගුණ සාම්‍යය ගැන සතිමත් ව ලියන ලද කවියකි. වලාකුළු අර්ථවාචී පයෝධර වියලි මහපොළොව ජල සම්පතින් පෝෂණය කරයි. මාතෘත්වයට භාග්‍යවන්ත වූ ස්ත්‍රිය සිය පයෝධරයන් වෙතින් ගලා එන කිරෙන් මිනිස් දරුවා පෝෂණය කරයි. වැහිවලා දකින මිනිස් සිතක ඇති වන ප්‍රහර්ෂය කවියා මෙසේ ප්‍රකාශයට පත් කරයි.

> **"ඇළ දොළ ගලා බස්වන්නට ඉවුරු කඩා -**
> **ගොඩබිම නිවා සනහන්නට සියලු විඩා**
> **ගණ වැහි වලා ඉගිලී එන විටදී අඬා -**
> **මට මහ සොම්නසක් ඇත! මොනරකුට වඩා"**[37]

**කුණාටුව** කාව්‍ය ග්‍රන්ථයේ **ගස් වැල් තිගැස්සෙයි මේ කුළු නැගෙන හඬින්**[38] **හැම වැහි වලාවම ඉගිලී ගෙන එද්දී**[39] යන කාව්‍යෝක්ති මේඝ යෝජනයට නිදර්ශන වෙයි. **වලාකුළු පෙරහැර** නමින් ඇ කාව්‍ය සංග්‍රහයේ දක්නට ලැබෙන පද්‍ය පසළොසකින් සමන්විත කවි පන්තිය ආරම්භ වන්නේ අහසේ පියාඹන මහ බලඇණිය යන ආමන්ත්‍රණය මේඝයට යොදමිනි.

> **'දිය වැල් ගීතවත් කොට ගිරි දුදුළු හිසේ - අහසේ පියාඹන**
> **මහ බල ඇණිය මෙසේ'**[40]

වලාකුළ සම්බන්ධ කොට ගෙන ජීවිතයට සමීප හෘදයංගම අත්දැකීම් කොළඹ යුගයේ තවත් කවීන් කිහිප දෙනෙකුන් විසින් ද ප්‍රකාශයට පත් කොට ඇත. ඒ අතර විමලරත්න කුමාරගම විශේෂ වෙයි.

---

36. එච්. ඇම්. කුඩලිගම: කුණාටුව; නව සංස්කරණය, ගීතනාත් කුඩලිගම, කොළඹ, 2013, 3 පිටුව.
37. එම.
38. එම; 4 පිටුව.
39. එම.
40. එච්. ඇම්. කුඩලිගම: ඇ; කොළඹ, 2013, 37 පිටුව.

ඔහු ජීවත් වූ කාලයේ ප්‍රේමය වේවා, විරහ වේදනාව වේවා ප්‍රකාශයට පත් කිරීමෙහි ලා වන ප්‍රබල මාධ්‍යය වූයේ කවිය යි. එහෙත් ඔහුගේ නිර්මාණ අධ්‍යයනයේ දීත් පෙනී ගියේ වැසි වලාකුළ යන අර්ථය දෙන මේඝ යෝජන අල්ප බව ය. **'වැහිබර වලා ඔරවන ගොරවන රුදුරු'**[41] යන්න මේඝයට දිය හැකි එක් නිදසුනකි. එහෙත් වැඩි වශයෙන් ඇත්තේ **වලාකුළක, සැන්දෑ වලාවල, වලාකුලක් ඇද, සුදු වලා පෙති, සරද සඳ සුදු වලා යුවළක්**[42] යන යෙදුම් මිස මේඝාර්ථවාචී වැසි වලාකුළ සිය කවියට හසු කොට ගත් අවස්ථා නොවේ.

මේඝ සංකල්පය නූතන කවීන් විසිනුදු සිය භාවිතයට ගත් බව පෙනේ. මෙහි දී නූතන යුගයේ සමාරම්භක යුගයට අයත් කවීන්ගේ නිර්මාණ අතර ද මේඝ සංකල්පය භාවිත කාව්‍ය නිර්මාණ රැසක් භාවිත ය. එහෙත් මෙහි දී පශ්චාත් නූතන කවි යුගය නියෝජනය කරන කවීන් දෙදෙනකුගේ පමණක් නිර්මාණ වෙත සාවධාන වන්නේ අධ්‍යයනයේ පහසුව සහ සීමාව සලකා ය. පළමු ව කනිෂ්ක මහේන්ද්‍ර විජයරත්න විසින් දිනකර හා මිහිකත වැහි අඳුර ගත් මේඝකූටයට සම්බන්ධ කරමින් ලියූ පහත සඳහන් කවියට අවධානය යොමු කරනු ලබන්නේ ඒ අනුව ය. මෙහි දී කවියා තමා භාවිතයට ගන්නා රූපක වේවා කාව්‍ය වස්තු වේවා මිහිකත වේවා ඒ සියල්ලට කිසියම් ජීවමාන භාවයක් ආරෝපණය කිරීමෙහි ලා යොමු වෙයි.

> **දෑත දිගු කර වැළඳ ගන්නට බලන් ඉන්නව දිනකරත්**
> **කන්ද උඩහින් කර තියාගෙන වැහි අඳුර ගත් මේ කුළත්**
> **මාස දෙක තුන හතර විඩකින් නො නා හිටියට මිහිකතත්**
> **කවුරු දන්නෙද වැටෙන තුරු අද වැස්ස ඉන්නෙත් උණ අරන්**[43]

ලක්ශාන්ත අතුකෝරල වැසි වලාකුළු නිසා ලැබෙන වර්ෂාව ගැන අර්ථවාහී පද්‍යයක් මෙසේ සමාජගත කරයි.

---

41. අල්විස් පෙරේරා පී. බී. : විමලරත්න කුමාරගම; කැලණිය, 1963, 117 පිටුව.
42. එම; 110, 150, 166, 196, 198 පිටු.
43. විජයරත්න; කනිෂ්ක මහේන්ද්‍රː වැස්ස ඉන්නෙත් උණ අරන්, බොරලැස්ගමුව, 2018, 35 පිටුව.

**හීන් හඬින් බිඳු බිඳු කොට සදා තනික දිය මහිමය**
**මහ පොළොවට ගලා බසින සාර සිහිනයේ ජීවය**
**මත් සම කොට - රැක එළි වැට ලැබ ආදරයේ රිද්මය**
**ඔබයි සොබාදහම ලියූ අති උත්තම හොඳම කවිය**[44]

තිලකසිරි ප්‍රනාන්දු ගායනවේදියාණන්ගේ හඬින් අද දවසේත් ඇසෙන කරුණාරත්න අබේසේකර ලියූ **එන්න මදනලේ** ගීතයේ කියැවෙන්නේ විරහී පෙම්වතකු සිය පෙම්වතියට සිය හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා මදනල දූතයකු කොට ගත් ආකාරය යි. කාලිදාස, මේඝය සිය ප්‍රේම පණිවිඩය ගෙන යන සම්ප්‍රේෂකයා බවට පත් කොට ගනිද්දී, අබේසේකර ඒ සඳහා මාධ්‍යය කොට ගන්නේ මදනල යි. එම ගීතය මේඝ සංකල්පය සමග සම්බන්ධ වන්නේ එහි කාලිදාසත් ඔහුගේ මේඝදූතයත් ගැන සඳහනක් වන බැවිනි.

**"ශෝක පණිවිඩය යවන්න ආදරිය බලා -**
**කාලිදාස කිවිඳු මේඝදූතයක් කළා**
**මට කොයින් ද එම වලා ආමි සුළඟෙ ඔබ බලා -**
**කියන්නකෝ මගෙ දුක ඇගෙ කණට ළංවෙලා"**[45]

මේඝ සංකල්පය භාවිතයට ගත් නිර්මාණකරුවෝ රැසක් වෙති. ඒ අතුරින් අධ්‍යයනයේ පහසුව සඳහා මහගමසේකර, සුනිල් ආරියරත්න සහ රත්න ශ්‍රී විජේරත්න යන ගේයපද රචකයන් තිදෙනාට මෙහි දී අවධානය යොමු කැරේ. මහගමසේකර නිර්මාණ අතර '**අහසේ නිල් පැහැය උරා - මේඝ වලා කඩින් පෙරා,**' '**මහා වැහි වලාවක් හදිසියෙ ඇද හැලිණි**[46] බඳු කාව්‍යෝක්ති මෙන් ම වැස්ස වහින්නට **ඉස්සර අහසේ වලාකුළින් විදුලිය කෙටුවා,**[47] **මේඝ මැදින් විදුලිය මෙන් නටා දිවෙනවා**[48] ආදි ගීතෝක්ති විද්‍යමාන ය. සුනිල් ආරියරත්න

44. අතුකෝරළ; ලක්ශාන්තඃ අමාවකේ සඳක් සිඹිමි; බොරලැස්ගමුව, 2007, 63 පිටුව.
45. අබේසේකර, කරුණාරත්න, හඬ ගුවන් විදුලි සඟරාව; කොළඹ, 2014, 111 පිටුව.
46. මහගමසේකර; හංස ගීතය සහ තවත් නිර්මාණ; සම්ඃ රත්නසිරි අරංගල; වැල්ලම්පිටිය; 1982; 143,146 පිටු.
47. මහගම සේකරගේ ගීත; මහගම සේකර; කොළඹ, 1976, 50 පිටුව.
48. මහගම සේකර නොපළ ගීත; සංස්ඃ රංජිත් අමරකීර්ති පලිහපිටිය, කොළඹ, 1984, 78 පිටුව.

ගීතාවලියේ එන නව සන කුළු බිඳ නව වැසි එයි නව මල් මැද තණ තැන්නේ,[49] වැස්ස වලාහක දෙවියනි,[50] හිතමිතුරු සුළඟ ළඟ එන වැහි වලාවට කියන්[51] හතර වටින් කළු කෙරුවට, වහින්නට හැකිනම් ගිගුම් දී, මේසයක් සේ හුදෙකලා වී[52] යන ගීත සංකථනයට ලක්කළ හැකි ය. රත්න ශ්‍රී ගීතාවලියේ එන අමරදේවයන් විසින් ගයනු ලබන පුතුනේ ගීතයේ දී අපට හමුවන්නේ ඍග්වෛදික සමාජයේ පර්ජන්‍ය දේවත්වයට නගා ඇති සෙයින් දේවත්වාරෝපිත වැහි වලාකුළ යි.

"වලාහක දෙවිඳු ඉසිවර - ඇසින් බල බලා පුතු දෙස-
ඉසුරු මුනි විහාරය ළඟ අන්න හිඳිනවා"[53]

සුදුනෙළුම ගීත සංග්‍රහයේ මුරුගසන් වැසි වසින මේඝයයි, නිල් අහස වැසෙයි-කළු වලාකුළක් ඇවිදින්, මේඝවලා දැක නැගෙනා - තැති ගැනිලා[54] යන ගීතෝක්ති තිබේ. ඔහුගේ ආලකමන්දා ගීත සංග්‍රහයේ එන කවියාගේ මේඝදූතය නිර්මාණය වන්දිමි හිමි වලා[55] යන සීගිරි කාව්‍යෝක්තියෙන් සමාරබ්ධ ව අපට සම්මුඛ කරවන්නේ ද මේඝ සංකල්පය යි. එසේ ම එහි මල් මංගල්ලය නම් ගීතයේ දෘශ්‍යමාන මේඝ ලතාවෙනි කම්පිත වූ සත නිවා දමන්නේ, මේඝ ලතාවෝ - දෙරණට ආවෝ[56] යන යෝජන ද මේඝ සංකල්පය හා සම්බන්ධ ය. එසේ ම රත්න ශ්‍රී පවසන්නේ මහාමේඝ හෙණ අකුණු විලාපය ඇසෙන මොහොතේ රන් දඹ රුක වන්නේ අම්මා බව යි. මහාමේඝ හෙණ අකුණු විලාපේ - රන් දඹ රුක මයෙ අම්මා[57] යන නිකිණි වැස්ස ගීත සංග්‍රහයේ දෘශ්‍යමාන ගීතෝක්තිය ඊට නිදර්ශන යි. මේ අතර මේ කුළු නැඟී විගස - පැරෙයි අකුණු සරින[58] යන ගීතෝක්තිය ඇත්තේ ද ඔහුගේ නිකිණි වැස්සේ ය.

49. ආරියරත්න; සුනිල්ඃ මකරන්ද; කොළඹ, 2000, 27 පිටුව.
50. ආරියරත්න; සුනිල්ඃ අරුන්දතී; කොළඹ, 1975, 40 පිටුව.
51. ආරියරත්න; සුනිල්ඃ ළා හිරු දහසක්; කොළඹ, 1978, 110 පිටුව.
52. ආරියරත්න; සුනිල්ඃ තුටු පඬුරු; කොළඹ, 1994, 31, 36, 120 පිටු.
53. විජේසිංහ; රත්න ශ්‍රීඃ වංකගිරිය අරණේ; නුගේගොඩ, 2002, 43 පිටුව.
54. විජේසිංහ; රත්න ශ්‍රීඃ සුදු නෙළුම; නුගේගොඩ, 2004, 37, 51, 67 පිටු.
55. විජේසිංහ; රත්න ශ්‍රීඃ ආලකමන්දා; නුගේගොඩ, 2007, 114 පිටුව.
56. එම; 119 පිටුව.
57. විජේසිංහ; රත්න ශ්‍රීඃ නිකිණි වැස්ස; කොළඹ, 2012, 28 පිටුව.
58. එම; 42 පිටුව.

## 04. මේඝ සංකල්පය පිළිබඳ වෛදික සාහිත්‍ය ප්‍රවණතා

ඍග්වේදාගත ජල සූක්ත අතර එන එක් සූත්‍රයක **'අපාං නපාත්'** නමින් දෙවියෙක් නිරූපිත ය. ඉන්ධනයකින් තොර ව තමා ම දැල්වෙන, විදුලිය නමැති වස්ත්‍රයෙන් සැරසුණු රන්වන් පැහැයෙන් යුතු මේ **අපාං නපාත්** අග්නිගේ ස්වරූපයක් ලෙස ද දක්වා තිබේ. ඔහු සැඟ ව සිටින තැන වන්නේ වලාකුළු ය.[59]

සොබාදහමේ අපූර්ව නිර්මාණයක් වන අග්නි හෙවත් ගින්න තුළ දෙවියන් දුටු කවියා ඒ දෙවියන් වර්ණනා කිරීමේදී යොදා ගත්තේ ද සොබාදහමේ වස්තූන් ය. හිරු, වලාකුළ, විදුලිය, අහස, පොළොව සහ ජලය වැනි සොබාදහමේ අංග, අග්නි හා අතිසමීප ලෙස සම්බන්ධ කොට දක්වා තිබීමෙන් පැහැදිලි වන්නේ එම සත්‍යය යි. පර්ජන්‍ය දේව සංකල්පය පිළිබඳ වන පහත සටහන මේඝ සංකල්පය ගැන වන සඳහනකි.

> **"උදෑසන හිරු තුළ, දැල්වෙන ගින්න තුළ ආලෝකය දුටු ඍග්වේද කවියා විදුලි රේඛාවක චමත්කාරයෙන් මත් ව බියමුසු බැතියකින් ඒ දෙස බැලුවේ ය. වලාකුළක සුන්දරත්වය සහ අසිරිය ද දුටුවේ ය. මේ දැකීම ය, ඍග්වෛදික කවියා තුළ 'පර්ජන්‍ය දේව සංකල්පය' ජනිත වීමට ඉවහල් වූයේ. පර්ජන්‍ය යනු වැහි වලාකුළ යි. ඊට සංස්කෘත භාෂාවෙන් 'පයෝධර' යයි ද කියනු ලැබේ. මේ පයෝධර යන වචනය පියයුරු යන අරුත් හි ද යෙදෙයි. 'පයස්' සහ 'ධර' යන පද ද්වයේ සමවායෙන් පයෝධර යන වචනය සැදෙයි. 'පයස්' යන්නෙහි ජලය සහ කිරි යන අරුත් ඇත. 'ධෘ' ධාතුවෙන් සැදෙන 'ධර' යන්නෙන් අදහස් වන්නේ දැරීම යි. මේ අනුව ජලය දරන තැන යන අරුතින් වලාකුළ පයෝධර නම් වන අතර කිරි දරන තැන යන අරුතින් පියයුරු පයෝධර නම් වෙයි. මේ දෙකින් ම සිදු වන්නේ පෝෂණය පිළිබඳ වන විශිෂ්ට කාර්යය යි. වලාකුළ සිය ජලයෙන් වැසි වස්වා මහ පොළොව නමැති දරුවා පලවැලින්**

59. Macdonell, Arthur Anthony, A Vedic Reader For Students, Madrass, 1957, pp 67, 68.

**යුතු කොට සශ්‍රීක කරයි. මාතාව ද සිය කිරි දී දරුවන් පෝෂණය කිරීමේ උදාර කාර්යය ඉටු කරයි. පර්ජන්‍ය දේව සංකල්පය මේ සියල්ල කැටි කොට ගත් චින්තාවක් වූ බව පෙනේ."**[60]

පර්ජන්‍යගේ සුවිශේෂ ලක්ෂණය වන්නේ වැසි වැස්වීම යි. ඒ වූකලී වලාකුළු මෙහෙවර යි. පර්ජන්‍ය පියකු වැන්න. ශාක නිෂ්පාදකයා මෙන් ම පෝෂකයා වන්නේත් පර්ජන්‍ය යි. මිනිස් කාන්තාවන් තුළ පමණක් නොව ගව දෙනුන්, වෙළඹුන් වැනි සත්ත්ව ජීවිත තුළ සශ්‍රීකත්වය ඇති කරන්නේත් ඔහු ය. මිහිකත ඔහුගේ බිරිඳ යි. ඔහුගේ සෙනෙහස එක තැනක නොරැඳී මුළු මහත් මිහිකත වෙත ගලා යයි. මෙසේ මිහිකත වෙත වර්ෂාව රැගෙන එන දයාබර ස්වාමියා වන්නේ පර්ජන්‍ය යි. ඔහු වර්ෂාව ගෙන දී මහී කාන්තාව තුළ ජීවය තැන්පත් කරයි. මේ සොබාදහමේ සුන්දර වූත් අර්ථවත් වූත් ක්‍රියාවලිය තුළ කවියා දේවත්වය දකියි.[61] මේඝය හා බැඳුණු පහත සඳහන් වර්ෂා ගීත අර්ථය තුළ ඇත්තේ ද උස් තැන් හා මිටියාවත් සම කරන වෛදික කවියා තුළ වූ ගැඹුරු වූත් දයාබර වූත් සොබාදම් ලැදි චින්තාව යි.

**"ගිගුරුම් දෙනු මැනවි. හෙණ පුපුරුවනු මැනවි. ජීව බීජය තැන්පත් කරනු මැනවි. ජලයෙන් බර වූ රියෙන් වටේට ඉගිලෙනු මැනවි. ලිහන ලද ජල පසුම්බිය පහළට අදිනු මැනවි. උස් තැන් ද මිටියාවත් ද සම වේවා!"**[62]

වර්ෂාවෙන් පසු ඇති වූයේ සශ්‍රීකත්වය යි. 'වැසි වැස ඇත' යන අරුත දෙන '**වර්ෂං අවර්ෂීඃ**' යන සුන්දර කාව්‍යෝක්තිය වෛදික කවි සිත පිළිසිඳුණේ එහෙයිනි. වැසි වලාකුළු මිහිකත මත මුදා හළ වර්ෂාව නතර වූ පසු කවියා හාත්පස බලයි. ඔහුට දක්නට ලැබෙන්නේ වියලි බිම් ජල බිම් බවට පත් ව ඇති ආකාරය යි. ඒ අනුව කවියා පවසන්නේ දැන් කාන්තාර පවා ජල බිම් බවට පත් ව ඇති බව ය. භෝජනය සඳහා පැළෑටි ද වැවී තිබේ. දැන් මේ පර්ජන්‍ය වෙත

60. සොබාදහම තුළ දෙවියන් දුටු ඍග්වේද කවියා; සමන් චන්ද්‍ර රණසිංහ, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම ශාස්ත්‍රීය සංග්‍රහය 1999 සංස් තෙරිපැහැ සෝමානන්ද හිමි ඇතුළු තවත් අය, පන්නිපිටිය, 1999, 174 පිටුව.
61. එම; 175 පිටුව.
62. ඍග්වේද v. 83 7 ඍග්වේද ගීතාවලී; නාරාවිල පැට්රික්, කොළඹ, 1997, 152 පිටුව.

මෙසේ ප්‍රදානය කැරෙන්නේ වර්ෂා ප්‍රදානය උදෙසා මානව ප්‍රජාව වෙතින් ලැබෙන අභිනන්දන ගීතය යි.

**"අවර්ෂීවර්ෂමුදු ෂූ ගෘභායා - කර්ධන්වාන්‍යත්යේතවා උ**
**අජීජන ඕෂධීර්භෝජනාය කම් - උත ප්‍රජා භ්‍යාවිදෝ මනීෂාම්"**[63]

## 05. මේඝදූත වියුක්ත සංස්කෘත සාහිත්‍යාගත ග්‍රන්ථ පඤ්චකයක් ආශ්‍රයෙන් මේඝ සංකල්ප ගවේෂණය

සංස්කෘත සාහිත්‍යාගත ආදි කාව්‍යය වන **රාමායණය** වලාකුළ සමාන කරන්නේ ලෝකය උදෙසා අපරිමාණ මෙහෙවරක නිරත ව ලොවට සදර්ථ ප්‍රදානය කොට වියැකී යන සාධු ජනයන්ට ය. ලෝකය මනා වැස්සෙන් සතුටු කරවා, නදී තට පුරවා, මිහිකත පිරුණු සස්‍ය ඇත්තක් කොට, වලාකුළු අහස අතහැර නැසෙතියි යන සුසංකල්පය වාල්මීකී ඍෂිවරයා මෙසේ ඉසොඳුරු කාව්‍යෝක්තියක් බවට පත් කරයි.

**"ලෝකං සුවෘෂ්ට්‍යා පරිතෝෂයිත්වා - නදීස්තටාකානි ච පූරයිත්වා නිෂ්පන්නසස්‍යාං වසුධාං ච කෘත්වා - ත්‍යක්ත්වා නභස්තෝයධරාඃ ප්‍රණෂ්ටාඃ"**[64]

**රාමායණයේ 'වේෂ්ටිතං මේරුශිඛරේ සතෝයමිව තෝයදම්'**[65] යන පාඨයෙන් කියැවෙන පරිදි රාවණ සම කරනු ලැබ ඇත්තේ මේරු පර්වතයේ දෘශ්‍යමාන සජල වලාකුළකට යි.

**ඍතුසංහාර** සංස්කෘත ඛණ්ඩ කාව්‍යයේ වර්ෂා ඍතුව පිළිබඳ වර්ණනා අතර වැසි වලාකුළ උදෙසා භාවිත වචන යෙදුණු පද්‍ය කිහිපයක් අපට හමු වෙයි. සිංහල පරිවර්තනයත් සමග මෙහි දක්වනු ලබන පද්‍යය විශේෂ වන්නේ එහි වලාකුළ හා සාම්‍යයක් දක්වන ජීව අජීව වස්තූන් සමග එය සමාන කොට ඇති බැවිනි.

---

63. ඍග්වේද v. 83. 10 ඍග්වේදසංහිතා - ද්විතීය භාගඃ; ශ්‍රීමත් සායනාචාර්ය විරචිත භාෂ්‍යසමේතා, සංස්ඃ එන්. එස්. සොන්තක්කේ සහ තවත් අය, පූනා, 1936.
64. රාමායණ iv.30.57 ශ්‍රීමද්වාල්මීකීරාමායණම්;මූලමාත්‍රම්, සංස්ඃ රාමනාරායණදත්තශාස්ත්‍රී, ගෝරඛ්පුර්, 1963.
65. එම; රාමායණ v.49.14

**"නිතාන්තනීලෝත්පලපත්‍රකාන්තිභිඃ-**
**ක්වචිත් ප්‍රභින්නාඤ්ජනරාශිසන්නිභෛඃ**
**ක්වචිත් සගර්භප්‍රමදාස්තනප්‍රභෛඃ-**
**සමාචිතං ව්‍යෝම ඝනෛඃ සමන්තතඃ"**[66]

කිසියම් තැනක අතිශය නිලුපුල් පත් කාන්තියෙන් යුතු වලාකුළුවලින් ද තව තැනක වෙසෙසින් බිඳුණු අඳුන් රැසක් බඳු වලාකුළුවලින් ද තවත් තැනක ගැබ් ගත් කාන්තාවකගේ පියයුරු පැහැයෙන් යුතු වලාකුළුවලින් ද අහස හාත්පස ගැවසී ගන්නා ලදී.

**ඍතුසංහාරයේ** වර්ෂා ඍතු වර්ණනයේ සමාරම්භක පද්‍යයේ පොද දිය සහිත වලාකුළු මතැතුන්ට සමාන කැරෙන **'සශීකරාම්භෝධරමත්තකුඤ්ජරඃ'**[67] යන කාව්‍යෝක්තිය ඇත. එහි තෙවැන්න වලාකුළු ගැන ම ලියැවුණු පද්‍යයකි. පිපාසයෙන් පීඩිත කැඳැති පක්ෂීන් විසින් අපට ජලය දෙවයි යන ආයාචනයට අනුව බොහෝ සෙයින් ජලය වර්ෂණය කරන්නා වූ මනහර හඬැති වලාකුළු සෙමින් සෙමින් ගමන් කරන බව එහි සඳහන් ය.

**"තෘෂාකුලෛශ්චාතකපක්ෂිණාං කුලෛඃ -**
**ප්‍රයාචිතා තෝයභරාවලම්බිනඃ**
**ප්‍රයාන්ති මන්දං බහුධාරවර්ෂිණෝ -**
**බලාහකාඃ ශ්‍රෝත්‍රමනෝහරස්වනෛඃ"**[68]

මෙයට අමතර වශයෙන් **මේඝවාචී** වචන වන **පයෝමුච්, පයෝධර, අම්භෝධර, ජලමුච්, තෝයද, ජලධර**[69] යන වචන ද **ඍතුසංහාරයේ** දෘශ්‍යමාන ය.

**කුමාරදාසයන්ගේ ජානකීහරණයේ** ස්ථාන රාශියක **මේඝ** යන වචනය හෝ එහි පාරිභාෂික යෙදුම් හෝ හමු වෙයි. එහි ප්‍රථමාංකයේ එක් පද්‍යයක අර්ථය වන්නේ සරත්කල සුදු වලාකුළු, තුඟු මතුමහලෙහි කොබෝගෙඩි වළල්ල වැළඳ, මිහිඟුබෙරවල දෙන ලද ස්වකීය හඬ ඇති සිය ධ්වනි ඇත්තේ ප්‍රාසාද කාන්තියේ බෙදීම කැමති වන්නේ ය යන්න යි.

66. ඍතුසංහාර ii. 2 The Rthusamhara of Kalidasa with Sanskrit Text, edited by Shastri Vyankatacharya Upadhye & M.R. Kale, Delhi, 1997, page 15.
67. ඍතුසංහාර II.I.
68. ඍතුසංහාර II.3.
69. ඍතුසංහාර II.10, 16, 19,21,22,27.

**"ආලිංග්‍ය තුංගං වඩභී විටංකං විශ්‍රාණිතාත්මධ්වනිපුෂ්කරේෂු
යත් සෞධකාන්තේරිව සංවිභාගඃ වවේ්‍ර සිතං ශාරදමභ්‍රවෘන්දම්"**[70]

මන්ථවාතයෙන් කරකැවෙන වලාකුළ යන අර්ථය දෙය '**මන්ථවාතභ්‍රමන්මේඝ**'[71] යන යෙදුම ද ලංකාවේ අකාලයේ පවා වලාකුළු ගැඹුරු කොට ගර්ජනා කරන්නේ යන අර්ථවාචී '**ධීරං ගර්ජන්ති ලංකායාමකාලේ වාරිදා**'[72] යන යෙදුම ද **ජානකීහරණ**යෙන් සමු වෙයි. . එසේ ම පිළිවෙළින් **ජලදා, වාරිදං, කෘෂ්ණමේඝ සහ අසිතවාරිද, මේඝ, අම්බුද, ජලධර, ජලදකාල, පයෝධර, ජලධරස්‍ය, ජලධරේ, වාරිදශීකර, ජලදෝදයේ, වාරිදේ, පයෝමුච්, මේඝස්‍ය හෘදයේ, පයෝද කාලස්‍ය, පයෝධරස්පර්ශ**[73] යන යෙදුම් ද එහි විද්‍යමාන ය.

දණ්ඩීකෘත දශකුමාරචරිතයේ ප්‍රථමෝච්ඡ්වාසයේ එන රාජවාහන කුමරුන්ගේ හඬ '**අභ්‍රනිර්ඝෝෂගම්භීරේණ ස්වරේණ**'[74] යන වචන යොදමින් කවියා සමාන කරන්නේ මේඝ ගර්ජනාවකට යි. මේ අතර එහි නිල් වලාකුළු කරණ කොට ගෙන මහත් වූ අන්ධකාරයෙන් ඝන ව වැසී ගිය රාජ වීදියක රාත්‍රී දර්ශනයක් ගැන වර්ණිත වන්නේ "**නීලනීරදනිකරපීවරතිමිරනිබිඩිතායාං රාජවීථ්‍යා...**"[75] ආදි වශයෙනි. තව ද එහි සැතපෙන රාජ කන්‍යාවක සම කරනු ලැබ ඇත්තේ සරත් සමයේ වලාකුළ නමැති උකුළෙහි නිදන විදුලියට යි.[76] එහෙත් ඒ වලාකුළ මිස වැසි වලාකුළ නොවේ.

ශ්‍රී ජයදේවකෘත **ගීතගෝවින්දයේ** සමාරම්භක පද්‍යයේ 'මේකුළෙන් අහස සිතිඳු ව ඇත' යන අර්ථය දෙන '**මේඝෛර්මේදුරමම්බරං**'[77] යන්න ඇත. අනතුරුව ශ්‍රී කෘෂ්ණ දෙවියන්

---

70. ජානකීහරණ I.9 ශ්‍රී කුමාරදාසකෘත ජානකීහරණ මහාකාව්‍යය; සංස්: රත්මලානේ ශ්‍රී ධර්මාරාම නා හිමි, මහරගම, 1963, 4 පිටුව.
71. ජානකීහරණ II.13 එම; 34 පිටුව.
72. ජානකීහරණ II. 66 එම; 45 පිටුව.
73. ජානකීහරණ II.26, V.29, VIII.90, IX.5, XI.40,41,46,48,52,60,80,81,83,92 XII.12,13. එම; 81, 104, 171, 176 - 231, 237, 238, 241, 247 පිටු.
74. ශ්‍රීමද්දණ්ඩින්විරචිත දශකුමාරචරිත; උත්තරපීඨිකා: කේ. බී. ජයවර්ධන සහ පුස්සැල්ලාවේ ඤාණරතන හිමි, කොළඹ, 2017, 59 පිටුව.
75. එම 92 පිටුව.
76. එම 134 පිටුව.
77. ගීතගෝවින්ද I.I.I ශ්‍රී ගීතගෝවින්දම්: සම්: මහාරාජ් දීන් දීක්ෂිත; බරණැස, 1951, 3 පිටුව.

ඇඳි වත **'වසනං ජලදාභං'**[78] වශයෙන් වලාකුළකට සම කැරේ. වරෙක කෘෂ්ණ දේව නව වලාකුළ යන අර්ථය දෙන **අභිනව ජලධර**[79] යනුවෙන් ආමන්ත්‍රිත ය. තව වරෙක කෘෂ්ණ ලලාටය ගන වළා සුමුයෙක සැලෙන සඳු පරයන සඳුන් තිලක සාම්‍යයෙන් ගෙන හැර දක්වා ඇත.[80] තවත් තැනෙක කියැවෙන්නේ රාධා කෘෂ්ණ යැයි සිතා අනල්පතිමිර ජලධරයක්[81] එනම් ගන අඳුරු වලාකුළක් සිප වැළඳ ගත් බව යි. ගීතගෝවින්දයේ එක් තැනක කියැවෙන **'සජල ජලද සමුදය රුචිරේණ'**[82] යන ගීතෝක්තියේ දී කෘෂ්ණ සම කරනු ලැබ ඇත්තේ දිය සහිත වලාවක් පැහැසර ලෙස උදාවන ආකාරයට යි.

## 06. මේඝ සංකල්පය පිළිබඳ සංස්කෘත සාහිත්‍යාගත උපරි ප්‍රකාශනය කාලිදාසයන්ගේ මේඝදූතය

**මේඝදූතයේ** මේඝය ම මූලය කොට ගනිමින් ඊට අදාළ සමස්ත සංසිද්ධිය විවරණය කැරේ. සමීප වර්තමානයේ යථෝක්ත කෘතියට වටගෙදර විමලබුද්ධි හිමියන් විසින් කරන ලද ප්‍රාමාණික සිංහල පරිවර්තනයේ එන දීර්ඝ ප්‍රස්තාවනාවේ සඳහන් වන පරිදි ශ්‍රී ලංකාවේ කෝට්ටේ යුගයේ දී රචිත සියලු සංදේශ කාව්‍යයන්ට පූර්වාදර්ශය වූයේ මේඝදූතය යි. එසේ ම පශ්චාත්කාලීන සංස්කෘත සාහිත්‍යය තුළ පහළ වූ සියලු දූත කාව්‍යයන්ට පූර්වාදර්ශය වූයේ ද මේඝදූතය යි.[83] මේඝදූතයේ කියැවෙන පරිදි එක්තරා යක්ෂ ගෝත්‍රික පෙම්වතෙක් සිය රාජ කාර්යයෙහි වූ ප්‍රමාදයක් කරණ කොට ගෙන සිය සෙන්පතියාගෙන් රාමගිරි අසපුවට ඔහු පිටුවහල් කිරීමෙහි ලා වන දඬුවම ලබයි. එම දඬුවමට අනුව පෙම්වතාට පුරා වසරක් එහි නැවතී සිටීමට සිදු වෙයි. මේ වූ කලී පෙම්වතා පෙම්වතියගෙන් දීර්ඝ කාලයකට දුරස් කිරීමකි. එය මේ විරහනීය පෙම්වතුන් යුවළට දරාගත නොහෙන අසීරු අත්දැකීමක් වෙයි. වර්ෂා ඍතුව සමීප වද්දී

78. ගීතගෝවින්ද I.I.8 එම; 8 පිටුව.
79. ගීතගෝවින්ද I.2.7 එම; 11 පිටුව.
80. ගීතගෝවින්ද II.5 එම; 24 පිටුව.
81. ගීතගෝවින්ද VI.6 එම; 58 පිටුව.
82. ගීතගෝවින්ද VII.35 එම; 73 පිටුව.
83. මහාකවිකාලිදාසවිරචිතමේඝදූත විස්තරාර්ථ සහිත පදගත සන්නසඃ සම්ඃ වටගෙදර විමලබුද්ධි හිමි, නුගේගොඩ, 2024 xxxvi, xxxvii පිටු.

පෙම්වතාට සිය පෙම්වතිය සිහිපත් වෙයි. එහෙත් ඔහුට ඇය වෙත පෙම්පතක් හෝ වෙනයම් පණිවිඩයක් හෝ යැවීමට ක්‍රමයක් නැත. මෙසේ විරහ වේදනාවෙන් පීඩිත පෙම්වතා කිසියම් අස්වැසිල්ලක් ලබන්නේ අහසේ පාව යන වැහි වලාකුළක් දැකීමෙනි. ඒ මේඝය ම සිය දූතයා කොට ගනිමින් සිය පෙම්වතියට පණිවිඩයක් යැවිය නොහැකි ද යන කල්පනය පෙම්වතාගේ සිතෙහි ඇති වෙයි. මුළු මහත් මේඝදූතය පුරා අන්තර්ගත ව ඇත්තේ මේ පෙම් පණිවිඩය යි.

මේඝදූතය **පූර්ව මේඝය** සහ **උත්තර මේඝය** වශයෙන් ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත ය. උත්තර මේඝයෙහි අන්තර්ගත පද්‍ය සංඛ්‍යාව සැට දෙකකි; උත්තර මේඝයෙහි පද්‍ය පනස් දෙකකි. සමස්ත කෘතිය හුයක් මෙන් එකිනෙකට සම්බන්ධ කරන්නේ මේඝය යි. අපට මේඝදූතයේ දී කවියා පළමුවෙන් මේඝය මුණ ගස්වන්නේ පූර්වමේඝයේ ද්විතීය පද්‍යයේ දී ය. ඒ ඇසළ මස පළමු දිනයෙහි වැළඳගත් සානුව ඇති ඉවුරු බිඳීමෙහි ලා දක්ෂ වූ ඇතකු මෙන් දර්ශනය වන වලාකුළක් දුටු බව කීමෙනි.

> **"ආෂාඪස්‍ය ප්‍රථමදිවසේ මේඝමාශ්ලිෂ්ටසානුං -**
> **වප්‍රක්‍රීඩාපරිණතගජඃ ප්‍රේක්ෂණීයං දදර්ශ"**[84]

කාලිදාසයන්ගේ කවිතාවෙහි සුවිශිෂ්ට ලක්ෂණයකි, සොබාදහම තුළ සත්ත්ව ස්වභාව සහ මානව චරණ දැකීමේ ප්‍රවණතාව. මේඝාලෝකය හෙවත් මේඝය දර්ශනය වන කල්හි සුවසේ හිඳින දනන් සිත වුව විකෘතියට පත් වෙයි. එහෙයින් වෙනදා ආදරයෙන් වැළඳගත් චරිතයෙන් දුරස් වූ කල්හි එබඳු තැනැත්තකු ගැන කියනු ම කවරේ දැයි අසයි. ඒ වූකලී වලාකුළ සහ විරහි ජනයන් අතර ඇති සහසම්බන්ධතාව අතර ඇති අවියෝජනීයත්වය ප්‍රකාශයට පත් කිරීමකි.

> **"මේඝාලෝකේ භවති සුඛිනෝපප්‍යන්‍යථාවෘත්ති චේතඃ**
> **කණ්ඨාශ්ලේෂප්‍රණයිනි ජනේ කිං පුනර්දූරසංස්ථෙ"**[85]

---

84. මේඝදූත 1. 2 The Meghaduta of Kalidasa, with the Commentary (Sanjivani) of Mallinatha edited with a literal English Translation by M. R. Kale, Bombey, 1934 page 5.

85. මේඝදූත 1.3 page 9.

වර්ෂා සමය විරහ වේදනාව අත්‍යුත්සන්න ව දැනෙන කාලය බැවින් වර්ෂාවේ දූතයාට ම සිය පෙම්වතියගේ ප්‍රාණය දරා ගන්නා ශක්ති ප්‍රදායකයා වෙන්නැයි කියයි. මෙහි දී වර්ෂාව හැඳින්වීම සඳහා සංස්කෘත භාෂාවේ යෙදෙන එක් වචනයක් වන්නේ ශක්තිනී ය. මේ සංවේදනීය අවස්ථාවේ දී පෙම්වතා සිය පෙම්වතිය සනසන්නට සිතන්නේ තමා සුවසේ හිඳින්නේ ය යන පණිවිඩය එනම් ස්වකුශලමයී ප්‍රවෘත්තිය ඇය වෙත මේඝය මගින් සම්ප්‍රේෂණය කිරීමට සැලැස්වීමෙනි. එහෙත් පෙම්වතා පිළිබඳ සත්‍යය වන්නේ ඔහු සතුටින් නොව අතිමහත් විරහ වේදනාවෙන් පීඩිත ව සිටින බව යි. අභිනව කුටජ කුසුමින් පුද ලද මේඝයට ප්‍රීතිපූර්වක වදන් පවසමින් හදවතේ නැති සතුට ඇති බවක් මවා පෙන්වන්නේ එහෙයිනි.[86]

මේඝදූතයෙහි නිරූපිත පෙම්වතා යනු සප්‍රාණ ජීවීන් සහ අප්‍රාණ වස්තූන් පිළිබඳ වෙනස මනාසේ අවබෝධ කොට ගත්තෙකි. එහෙත් ජීවිතයේ තීරණාත්මක අවස්ථාවන්හි දී කවර තැනැත්තෙක් හෝ සිය වේදනාව ප්‍රකාශ කිරීමට සමීපයේ කිසිදු ප්‍රාණියකු නොමැති නම් ළඟ ඇති අජීවී වස්තුවකට වුව සිය දුක පළ කරන්නට කටයුතු කරයි. මේඝය යනු ධූමය, ආලෝකය, ජලය සහ පවන යන සාධක සතරෙහි එක්වීම නිසා සැදෙන අජීවී වස්තුවක් බව ඔහු දනියි. එසේ ම ඉන්ද්‍රිය ශක්තිය ඇති ප්‍රාණීන් විසින් ගෙන යායුතු සන්දේශකරණය මේඝයට කළ නොහැකි බව ද ඔහු දනියි. එහෙත් කිරීමට අන් කිසිවක් නොමැති කල සිය ඉෂ්ටාර්ථ සම්පාදනය උදෙසා අජීවී වස්තූන් වෙත වුව ආයාචනා කිරීමට විරහී ජනයෝ උත්සුක වෙති. එබඳු අය චේතන අචේතන භාව නොසලකන බැවිනි.[87] මේ මානව මානසික ස්වභාවය වූ කල්හි කාල දේශ ආගම් ජාති ඈ භේදයන්ගෙන් තොර ව මෙලොව ජීවත් වූ ජීවත් වන කවර හෝ මානවයකුට දැනෙන තත්ත්වයකි. සංස්කෘත කවියා හෝ සිංහල ගේය පද රචකයා පවසන මේ මෙහෙවර වලාකුළකට හෝ සුළඟට ඉටු කළ හැකි දෙයක් ද? මෙයට කාලිදාස සිය මේඝදූතයේ දී මනා පිළිතුරක් දෙයි. ඔහු පවසන්නේ මේඝය, ඔබ ලොව ප්‍රසිද්ධ වූ පුෂ්කර ආවර්තක යන යන ශ්‍රේෂ්ඨ මේඝ වංශයෙහි ජන්මලාභය ලද කැමැති රුවක් ගත හැකි ඉන්ද්‍ර දෙවියන්ගේ ප්‍රධාන පුරුෂයා බව තමා දන්නා හෙයින්

86. මේඝදූත 1.4 page 11.
87. මේඝදූත 1.5 page 13.

දෛවානුකූල ව හෘදය බන්ධුවරියගෙන් වෙන් කරන ලද තමා ඔබ කෙරෙහි ආයාචනා කරන්නකු බවට පත් වී ඇති බව යි. ආයාචකයා විසින් ආයාචිත චරිතයේ ඇති ගුණෝත්කර්ෂය නිසා එම ඉල්ලීම ඉටුවුවත් නැතත් එහි දෝෂයක් නොවේ. එසේ ම උත්තම චරිතයකින් යම් ඉල්ලීමක් කොට ඒ නිෂ්ඵල වීම නීචයකු වෙතින් ඉල්ලීම් ඉටු කොට ගැන්මට වඩා ශ්‍රේෂ්ඨ බව ද එහි කියැවෙයි.

**"යාඥා මෝඝා වරමධිගුණේ නාධමේ ලබ්ධකාමා"**[88]

සංස්කෘත සාහිත්‍යය මේඝය සාධුජනයනට සම කරයි. තත් සාහිත්‍යාගත ප්‍රසිද්ධ ප්‍රකාශයක දැක්වෙන්නේ සජ්ජනයන් වලාකුළු මෙන් ලොව දුර්ලභ ව උපදින බව යි.

**"ජායන්තේ විරලා ලෝකේ ජලදා ඉව සජ්ජනාඃ"**[89]

වර්තමාන කාල ප්‍රථම පුරුෂ ඒකවචන හා බහුවචන සඳහා ප්‍රත්‍යය කිහිපයක්ම මෙම අවධියේ දී යෙදී තිබූ බව සීගිරි පද්‍ය විමසීමේ දී පැහැදිලි වේ. එනම්, ඒකවචනය සඳහා /යි/, /ය්/, /යෙ/, /ය/, /ඒ/, /නි/ යන ප්‍රත්‍යයත්, බහුවචනය සඳහා /ත්/, /ති/, /ත්හ/ යන ප්‍රත්‍යයත් යෙදී තිබේ.

| | | |
|---|---|---|
| වෙ | + | යි |
| වෙ | + | ය් |

යෙ (සාධිත ක්‍රියා ධාතුව/ ය් + එ)

| | | |
|---|---|---|
| වෙ | + | ත් |
| ය | + | ති |
| ය | + | ත් |
| යෙ | + | ත් |
| යෙ | + | ති |
| යෙ | + | ත්හ |

කෙරෙ (සාධිත ක්‍රියා ධාතුව පමණක්ම යෙදීම)

සිදත් සඟරා කතුවරයා වර්තමාන කාල ප්‍රථම පුරුෂ ඒකවචනය සඳහා /ඔ/, /ඒ/, /ඉ/, /ආ/ යන ප්‍රත්‍යයත්, බහුවචනය සඳහා /අත්/, /ඉත්/, /එත්/, /ඔත්/ යන ප්‍රත්‍යයත් දක්වා තිබේ. නමුත් සීගිරි පද්‍යය විමසීමේ දී ප්‍රථම පුරුෂ ඒකවචන හා බහුවචන සඳහා /යි/ හා /ති/ යන ප්‍රත්‍යය යෙදීම මෙම අවධියේ සාමාන්‍ය ක්‍රමය බව හඳුනාගත හැකිය. මීට අමතරව /ය්/, /ත්/, /ත්හ/ වැනි ප්‍රත්‍යය ද යෙදී තිබේ. විශේෂයෙන් ශුද්ධ ක්‍රියා ධාතුවෙහි සාධිත ස්වරූපය පමණක්ම වර්තමාන ප්‍රථම පුරුෂ ඒකවචනයෙහි යෙදී ඇත. මෙහි දී ශුද්ධ ක්‍රියාව ස්වර පූර්වීකරණයට ලක්ව තිබේ.

අතීත කාල ක්‍රියා වරනැගෙනුයේ මූල ධාතුවෙන් හෝ ප්‍රයෝජ්‍ය / කර්ම කාරක ක්‍රියා ශබ්දයෙන් හෝ සාධිත අතීත ක්‍රියා ශබ්දයට, පුරුෂ, වචන ප්‍රත්‍යය යෙදීමෙනි. අතීත ක්‍රියා ශබ්ද දෙකකි. එනම්, සාමාන්‍ය අතීත ශබ්දය හා කෙටි අතීත ශබ්දය යනුවෙනි. සාමාන්‍ය අතීත ශබ්ද සකස් වනුයේ අකාරාන්ත ධාතුවල ස්වර පූර්වීකරණය වීමෙනි. එනම්,

උ > ඉ, ඌ > ඊ
ඔ > එ , ඕ > ඒ
අ > ඇ, ආ > ඈ වීමෙනි.

(කරුණාතිලක, 2022)

ක්‍රමික ධාතුවල ස්වර පූර්වීකරණය වීමෙන් හා ධාත්වන්ත ස්වරය -ඊ- , -ඌ- ආදේශ වීමෙන් කෙටි අතීත ශබ්ද සෑදේ. එනම් සාධිත අතීත ශබ්දයට පුරුෂ, වචන ප්‍රත්‍යය යෙදීමෙන් කර්තෘකාරක කෙටි අතීත ශබ්ද වරගැගෙයි. (කරුණාතිලක, 2022) සීගිරි පද්‍යවල උත්තම පුරුෂ අතීත කාල ක්‍රියාව සඳහා /මි/, /ම්/, /මො/, /ම්හ/ යන ප්‍රත්‍යය භාවිත වී ඇති බව ඉහත උදාහරණ විමසීමේ දී හඳුනාගත හැකිය. විශේෂයෙන් සීගිරි පද්‍යවල සඳහන් උත්තම පුරුෂ අතීත ශබ්ද කෙටි අතීතයෙන් යෙදී ඇති අතර ඉහත සඳහන් කරන ලද සියලු ලක්ෂණ ද අන්තර්ගත වේ. ඊට අමතරව ඇතැම් තැනෙක ධාතු අන්තයට -ඉ- ආදේශයක් ද සිදුව ඇත.

උදා:

| ශුද්ධ ධාතුව | සාධිත ධාතුව | ප්‍රත්‍යය එකතුවීම |
|---|---|---|
| බල- (බැලීමෙහි) | බැලි/ බැලී | බැලි + මි = බැලිමි |
| | | බැලී + මි = බැලීමි |
| | | බැලී + ම් = බැලීම් |
| | | බැලි + මො = බැලිමො |
| | | බැලි + ම්හ = බැලිම්හ |
| දන්- (දැනීමෙහි) | දති/ දත් | දති + මි = දතිමි |
| | | දත් + මො = දත්මො |
| කර- (කිරීමෙහි) | කෙළෙ/ කළ | කෙළෙ + මි = කෙළෙමි |
| | | කළ + මො = කළමො |
| එ- (පැමිණීමෙහි) | අයි/ආ/ අ | අයි + මි = අයිමි |
| | | ආ + මි = ආමි |
| | | අ + මි = අමි |
| ලිය- (ලිවීමෙහි) | ලීති/ලියි/ලී/ලි | ලීති + මි = ලීතිමි |
| | | ලියි + මි = ලියිමි |
| | | ලී + මො = ලීමො |
| | | ලී + මි = ලීමි |
| | | ලි + මි = ලිමි |

සීගිරි පද්‍යවල ඇතැම් ක්‍රියා ධාතුවක සාධිත ක්‍රියා මූලයෙහි අග ඇති ස්වරය ලොප් වී හලන්ත තත්වයට පත්ව අනතුරුව එම අන්ත ව්‍යඤ්ජනය ද්විත්ව වී ඊට පසුව ධාතුව අකාරාන්ත වී ප්‍රත්‍යය එකතු වී තිබේ.

උදා:
ජන් (දැනීමෙහි)
ජත් + මො (ජ + ත්ත් + අ + මො) = ජත්තමො/ජත්තමහ/

මෙම උදාහරණ අනුව පැහැදිලි වන තවත් කරුණක් නම් එකම ශුද්ධ ක්‍රියා ධාතුව අතීත කාලික ප්‍රත්‍යය එකතුවීමේ දී විවිධ සාධිත ස්වරූප හඳුනාගත හැකි වීමයි.

| | | | | |
|---|---|---|---|---|
| | අයි | = | ┌ | අයිමි |
| එ ධාතුව | ආ | = | ┤ | ආමි |
| | අ | = | └ | අමි |
| | ලිති | = | ┌ | ලිතිමි |
| ලිය ධාතුව | ලියි | = | ┤ | ලියිමි |
| | ලී | = | │ | ලීමි |
| | ලි | = | └ | ලිමි |

මේ අනුව හඳුනාගත හැකි තවත් කරුණෙක් නම්, උත්තම පුරුෂ වර්තමාන කාල ඒකවචන /මි/, /මු/ ප්‍රත්‍යයන්ට පූර්වයෙන් -ඉ- කාරය ද (බැලිමි) බහු වචනයෙහි /මු/, /මො/, /ම්හ/, /ම්හු/ යන ප්‍රත්‍යයන්ට පූර්වයෙන් -උ- කාරය ද (බැලුමු) වේ. යන සිදත් සඟරාව දැක්වූ අතීත වර්තමාන භේදය විවාදාපන්න බවයි. සීගිරි පද්‍යයන්හි පෙනෙන නියම උදාහරණයන්ගෙන් එය සනාථ කළ නොහැකිය.

සීගිරි පද්‍යවල ක්‍රියාපද විමසීමේ දී අතීත කාල මධ්‍යම පුරුෂ ඒකවචනය සඳහා /හි/, /එ/, /ඊ/, යන ප්‍රත්‍යයත්, බහුවචනය සඳහා /යු + (වහ), /ඔ/, /හු/, /යො/ යන ප්‍රත්‍යයත් යෙදී තිබේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| උදා: | වි | + | හි | = | විහි (වෙ ධාතුව) |
| | ගිය | + | එ | = | ගියෙ (ය ධාතුව) |
| | ගිය | + | ඔ | = | ගියො (ය ධාතුව) |
| | ගිය | + | හු | = | ගියහු (ය ධාතුව) |
| | බල | + | ඊ | = | බැලී (බල ධාතුව) |

නූතන සිංහල ව්‍යවහාරයෙහි අතීත කාල මධ්‍යම පුරුෂ සඳහා /හි/ සහ /හු/ යන ප්‍රත්‍යය යෙදේ. එය සිදත් සඟරාවේ ද දක්වා තිබීමෙන් පැහැදිලිය. එහි දී ඉහත දක්වන ආකාරයට ශුද්ධ ධාතුවෙහි ස්වරූපය වෙනස් වී එම සාධිත ධාතුවට කාලික ප්‍රත්‍යය එකතු වේ. මේ ලක්ෂණය සීගිරි පද්‍යවල සඳහන් ක්‍රියාපද තුළද දැකිය හැකි ලක්ෂණයකි. නමුත් මෙම අවධියේ දී අතීත කාල මධ්‍යම පුරුෂ ඒකවචන හා බහුවචන සඳහා /එ/, /ඔ/, /ඊ/, /යු/ වැනි ප්‍රත්‍යය යෙදී තිබේ.

අතීත කාල ප්‍රථම පුරුෂය සඳහා සිදත් සඟරා කතුවරයා දක්වා ඇත්තේ /උෟ/, /ඔ/, /උ/, /උන්/ යන ප්‍රත්‍යයයි. සීගිරි පද්‍යවල

අන්තර්ගත මෙම කාලයට අයත් ප්‍රථම පුරුෂ ඒකවචනය සඳහා /යු/, /උ৩/, /යි/, /ඊ/, /ඒ/ ප්‍රත්‍යය ද, බහුවචනය සඳහා /උ/, /හු/, /යු(හු)/, /ˊ/ ප්‍රත්‍යය ද යෙදේ. විශේෂයෙන් මෙහි දී ප්‍රථම පුරුෂ ඒකවචනයෙහි එකම ශුද්ධ ක්‍රියා ධාතුවක ස්වර පූර්වීකරණයෙන් සාධිත ක්‍රියා ධාතු කිහිපයක් සකස් වී තිබේ.

උදා:

| | | |
|---|---|---|
| වෙ (වීමෙහි) ධාතුව | - | වුයු, වූ, වියි, වී |
| කර (කිරීමෙහි) ධාතුව | - | කෙළෙය්, කෙළෙ, කෙළෙයි |
| එ (පැමිණීමෙහි) ධාතුව | - | ආයෙ, අයෙ |
| ගන් (ගැනීමෙහි) ධාතුව | - | ගති, ගත, ගත් |
| ලිය (ලිවීමෙහි) ධාතුව | - | ලියි, ලී |

යනාදි වශයෙන් හඳුනාගත හැකිය. මේවා ස්වර පූර්වීකරණයෙන් එකම ධාතුව විවිධ ස්වරූපවලින් සකසාගෙන තිබේ.

වර්තමාන කාල වරනැඟීම මෙන් අනාගත කාල වරනැඟීම ශුද්ධ ආඛ්‍යාතයක් නොවෙයි. එනම් ක්‍රියාපදවල කෘදන්ත ස්වරූපයට කාලික ප්‍රත්‍යය එකතු වේ. අනාගත ක්‍රියා ශබ්දය සෑදෙනුයේ මූල ධාතුවට -න්-, -න්න්- ප්‍රත්‍යයන් යෙදීමෙන් අනාගත කාල ක්‍රියා පද සකසා ගැනීම සාමාන්‍ය ස්වරූපයයි. පුරුෂ/ නපුංසක ලිංග ඒකවචනයෙහි /ඒ/ ප්‍රත්‍යයද ස්ත්‍රී ලිංග ඒකවචනයෙහි /ඊ/ ප්‍රත්‍යයද උත්තම පුරුෂ බහුවචනයෙහි /ඒ/,/අ/ ප්‍රත්‍යයද මධ්‍යම පුරුෂ බහුවචනයෙහි /අ/ ප්‍රත්‍යයද ප්‍රථම පුරුෂ බහුවචනයෙහි /ඕ/, /ආ/ ප්‍රත්‍යයද යෙදීමෙනි. මේ අනුව පැහැදිලි වනුයේ අනාගත කාලය සඳහා කේවල -න්- හා ද්විත්ව -න්න්- යෙදීමෙන් වර්තමාන කෘදන්ත පද සකස් කොට ඒවාට කාලික ප්‍රත්‍යය එකතුකොට අනාගත කාල ක්‍රියාපද සකස් කොටගෙන තිබේ. සීගිරි පද්‍යවල මෙම අනාගතවාචී ක්‍රියාපද හමුවේ.

ළ තද් වත තා එ පසොමි මොළොකක් විය පහන්නෙමි (සීගිරි ගී - 304)

පවෙහි ආ කෙනෙක් මතු මෙ ජනනෙ (සීගිරි ගී - 527)

මන ම තම හට් මෙ ගත් දිගැස්නි කුම් කොට් සහන්නෙමි (සීගිරි ගී - 123)

සඟ වන් බෙයන්ද් ආ කල වන්නෙමි බලය් සිතතොස් (සීගිරි ගී - 536)

නොවි සිහි යන්නමහ මහවන් හෙළිල්ලබියැන් (සීගිරි ගී - 180)

වජනක් නැත්තෙය් අපට ඇවිද් යන්නමො අසදින් (සීගිරි ගී - 647)

පිය පහස මෙ දිගැස සන්දෙහි ලත් වෙමි සුවපත් (සීගිරි ගී - 536) (මුදියන්සේ, 2004)

මෙම සීගිරි පාඨවල සඳහන් අනාගත කාල යැයි සිතෙන ක්‍රියාපද පහත පරිදි දැක්විය හැකිය. එනම්,

පහන්නෙමි
ජනනෙ
සහන්නෙමි
වන්නෙමි
යන්නමහ
යන්නමො
ලත් වෙමි

මේවා කේවලව සැලකූ විට අනාගත කාල ක්‍රියාපද යැයි සැලකීම යුක්ති යුක්ත වේ. නමුත් මෙහි සඳහන් කළ යුතු වැදගත් කරුණ නම් මෙම පද වාක්‍ය හා සම්බන්ධ වී තිබිය දී ඉන් ගම්‍ය වන සමස්ත අර්ථය සැලකූ කල ඇතැම් පද මගින් අනාගතවාචී අදහසක් නොපැවසේ. ඒවා වර්තමාන අර්ථයෙන්ම යෙදී තිබේ.

ඉහත සඳහන් ක්‍රියාපද අතරින් **පහන්නෙමි, ජනනෙ, සහන්නෙමි, ලත්වෙමි** යනාදි ක්‍රියාපද මඟින් අනාගතවාචී අර්ථයක් ප්‍රකාශ වෙන අතර **වන්නෙමි, යන්නමහ, යන්නමො** යන ක්‍රියාපද රූපීය වශයෙන් අනාගත කාල ක්‍රියාපද වශයෙන් දැක්විය හැකි වුවද ඇතැම් පද මඟින් අනාගත කාලික අර්ථයක් ප්‍රකාශ නොවේ. නිදසුනක් වශයෙන් **ළ තද් වත තා එ පසොමි මොළොකක් විය පහන්නෙමි** යන සීගිරි පද්‍ය පාදයෙහි අදහස වනුයේ ඔබ වෙත යම්කිසි මොලොක් බවක් ඇති වුවහොත් මම පැහැදෙමි යන්නයි. මෙහි සඳහන් **පහන්නෙමි** යන පදය අනාගත කාල අර්ථයෙන් යෙදී ඇත යන්නට හේතුව වනුයේ මොළොක් බව ඇති වුවහොත් යනුවෙන් අනියමාර්ථ අසම්භාව්‍ය

ක්‍රියා පදයක් යෙදී තිබීමයි. එනම් ඇය කෙරෙහි මොළොක් බවක් තවමත් ඇති නොවූ බැවිනි. එහෙයින් මෙහි දී කවියාගේ පැහැදීම සිදු වන්නේ සීගිරි අප්සරාවන්ගේ මොළොක් බව ඇති වූ පසුවය. ඒ අදහසින් මෙම **පහන්නෙමි** යන පදය අනාගත කාල ක්‍රියා පදයක් ලෙස දැක්විය හැකිය. නමුත් මෙහි සඳහන් ඇතැම් ක්‍රියාපද මඟින් ස්ඵුට වන අදහස දෙස අවධානය යොමු කිරීමේ දී ඒවා වර්තමාන අදහසින්ම යෙදී තිබේ.

අනාගත කාලය සකස් කරගැනීමේ දී මෙහි හමුවන විශේෂ ලක්ෂණයක් නම් වර්තමාන කාල ක්‍රියාපද සමඟ අනාගත කාල වාචී උපපද භාවිත කොට තිබීමයි. ඒ බව **පවෙහි ආ කෙනෙක් මතු මෙ ජනනෙ** යන පාදයෙහි මතු යන අනාගත කාල වාචී උපපදය යොදා තිබීමෙන් **ජනනෙ** යන වර්තමාන කාල ක්‍රියාව අනාගත කාල අර්ථයෙන් යොදා තිබේ.

මේ අනුව සීගිරි පද්‍යවල අනාගත කාල ක්‍රියා රූප ආකාරයෙන් බහුතරයක් පද යෙදී තිබුණ ද එමගින් වර්තමාන අදහසක් ඉදිරිපත් වන අවස්ථා බහුලය. එමෙන්ම වර්තමාන කාල ක්‍රියා පද අනාගත වාචී උපපද යෙදීමකින් තොරව ද අනාගත කාල අර්ථයෙන් යෙදී ඇත. නමුත් එය රූපීය වශයෙන් වර්තමාන කාලයට අයත් වේ.

මේ අනුව පැහැදිලි වන කරුණ නම් පැරණි සිංහල භාෂාවෙහි අනාගත කාලය සඳහා වර්තමාන කාල ක්‍රියා පදය ද භාවිත කොට තිබේය යන්නයි. මෙහි දී පැරණි මූලාශ්‍රයන් කිහිපයක් විමසා බැලීම වැදගත් වේ. **බෙහෙදක් කෙරෙම් ද? යි විචාළෝ ය.....නැති කරවා ලූවොත් සෙසු කුමක් ද? දරුමලු පුඩුවෙන් මම නුඹට මිඬි වෙමි.** (ජයතිලක, 1964) මෙහි අදහස දෙස අවධානය යොමු කිරීමේ දී පැහැදිලි වනුයේ මිඬි වෙමි යන්න අනාගත කාල අර්ථයෙන් යෙදී ඇත. නමුත් මෙහි යෙදී ඇත්තේ වර්තමාන කාල ක්‍රියා පදයකි. කාව්‍යසේඛරයෙහි 10වෙනි සර්ගයෙහි 105වන පද්‍යයෙහි **මග රැඳුන අද තො නසි, ගෙට ගිය අඹුව නසි** (ඥාණවිමල හිමි, 1960). මෙය අනාගතාර්ථ වාක්‍ය ප්‍රකාශයකි. නමුත් මෙහි ක්‍රියා රූප වර්තමාන කාලයට අයත් ය. ගුත්තිලකාව්‍යයෙහි 193 පද්‍යයෙහි **සිල්ප සත්වෙනි දවස දක්වමි** (තිලකසිරි, 2017) යන පද්‍ය පාඨය මඟින් ද ප්‍රකාශ වනුයේ අනාගත කාල අදහසකි. මෙහි ද දක්වමි යනු වර්තමාන කාල ක්‍රියා රූපයකි. නමුත් අනාගත අර්ථයෙන් යෙදී ඇත.

මෙම පැරණි සම්භාව්‍ය ගද්‍ය පද්‍ය කෘතිවල සඳහන් වර්තමාන හා අනාගත යැයි සැලකෙන ක්‍රියා පද වර්තමාන හා අනාගත යන කාල දෙකෙහිම යෙදී ඇත. අනෙක් අතට නූතන සිංහල ව්‍යාකරණයෙහි හා සිදත් සඟරාවෙහි අනාගත කාලය පිළිබඳ සඳහන් වුවද පැරණි පතපොතෙහි මෙම රූප දෙකම කාල දෙකෙහිම යෙදී ඇති අයුරු හඳුනාගත හැකිය.

සීගිරි පද්‍යවල මේ ලක්ෂණය බහුලව දැකිය හැකිය. ඩබ්.එස් කරුණාතිලක මහතා සිංහල භාෂා ව්‍යාකරණය යන කෘතියෙහි කාල භේදය දක්වා ඇත්තේ අතීත හා අනතීත වශයෙනි. වාග්විද්‍යාත්මකව විමසා බැලීමේ දී ද පැහැදිලි වනුයේ භාෂණ සිංහලයෙහි ඇත්තේ අතීත හා අනතීත භේදය බවයි.

සීගිරි පද්‍යවල අනාගතාර්ථය ප්‍රකට කරන විශේෂ ක්‍රියාරූප කිහිපයක් ද හමුවේ. එනම් පහත සීගිරි පද්‍ය පාඨ සලකා බලමු.

අවුද් බැලුයොත් තා කියවි ගුණ එනරවරා (පද්‍යය - 75)

ලද වි සිහි එවි හෙ එවි ලයු මෙතෙක් කල් වත් (පද්‍යය - 465)

මෙ ලිය පියෙ එයුන් මෙ තමන් දිවි යවි යි පවසා (පද්‍යය - 543)

මෙම පද්‍යවල සඳහන් කියවි, එවි, යවි යන පද මඟින් අනාගතාර්ථයක් ප්‍රකාශ වේ. එනම්,

| | | |
|---|---|---|
| කිය | + | වි |
| එ | + | වි |
| ය | + | වි |

අනාගතයෙහි සිදුවිය යුතු යම්කිසි කාර්යයක් සඳහන් කළ යුතු අවස්ථාවන්හි දී නූතන කථා ව්‍යවහාරයෙහිද -වි- ප්‍රත්‍යයෙන් අන්ත ක්‍රියාරූප නිරතුරුව භාවිත කෙරෙයි. උදාහරණ වශයෙන් යාවි, කාවි, පැමිණේවි, බලාවි, සිනාසේවි වැනි පද දැක්විය හැකිය. එක් පැත්තකින් මෙම කියවි, එවි , යවි ආදි පද අනාගත කාල අර්ථයක් ප්‍රකට කරනවා මෙන්ම සීගිරි පද්‍ය තුළ එකල ව්‍යවහාර සිංහල බස් වහර යෙදී ඇත යන්න කදිම නිදසුනක් වශයෙන් ද දැක්විය හැකිය. මන්ද යත් මෙම වි ප්‍රත්‍යාන්ත ක්‍රියාපද නූතන ව්‍යවහාරයෙහි අනාගත අදහසක් දීම සඳහා නිතර භාවිත වනු දැකිය හැකිය. ඒ සඳහා වර්තමාන සිංහල බස් වහරේ එන පහත නිදසුන් හා සැසඳෙන අයුරු ύමසා බැලිය හැකිය.

එයා ගෙදර යාවි.
රජය විභාගය කල් දමාවි.
පාසල් නිවාඩු වාරය තව දික් කරාවි
මල්ලි හෙට ගෙදර ඒවි.

මෙම වි ප්‍රත්‍යාන්ත ක්‍රියාපද අනාගත කාල අනියමාර්ථ අර්ථයෙන් වත්මන් ව්‍යවහාර සිංහලයෙහි භාවිත වේ. එසේම අසම්භාව්‍ය ක්‍රියාපද සහිත වාක්‍යවල මෙම ප්‍රත්‍යාන්ත ක්‍රියාපද සිංහල බස් වහරෙහි යෙදේ. තවද, මෙම ප්‍රත්‍යාන්ත ක්‍රියාපද වාක්‍ය සමඟ යෝග්‍ය වීමේ දී හෙට, අනිද්දා වැනි අනාගත වාචී උපපද යෙදීම ද දැකිය හැකිය. මෙම ලක්ෂණ සීගිරි පද්‍යවලින් ද හඳුනාගත හැකි වීම ද විශේෂත්වයක් වශයෙන් දැක්විය හැකිය.

## සමාලෝචනය

ඉහත සඳහන් විමසීමට අනුව පැහැදිලි වනුයේ සීගිරි පද්‍යවල සඳහන් ක්‍රියාපදවල සංස්ථිතියෙහි විවිධතා හඳුනාගත හැකි බවයි. මතු සඳහන් කළ ආකාරයට සිදත් සඟරාවේ අතීත, වර්තමාන හා අනාගත යන ත්‍රෛකාලයටම අදාළව පුරුෂත්‍රයෙහි ප්‍රත්‍යය දක්වා තිබේ. නමුත් සීගිරි පද්‍ය විමර්ශනය කිරීමේ දී බහුලව යෙදී ඇත්තෙ අතීත හා වර්තමාන කාල ක්‍රියාපද භාවිත වන අතර අනාගත කාලය දැක්වීමේ දී බහුලව වර්තමාන කාල ක්‍රියාපද යෙදුනු අවස්ථා හඳුනාගත හැකිය. සීගිරි පද්‍ය තුළ අනාගත කාලික රූපය ගැන් වූ ක්‍රියාපද හඳුනාගත හැකි අතර ඇතැම් අවස්ථාවල එම අනාගත රූපය ගැන් වූ ක්‍රියාපද වර්තමාන කාල අර්ථයෙන් ද යෙදී ඇත. එමෙන්ම සිදත් සඟරාවේ සඳහන් ප්‍රත්‍යයවලට අමතරව සීගිරි පද්‍ය පිළිබඳ විමසීමේ දී ක්‍රි.ව. 8/9/10 ආදි යුගවල සිංහල භාෂාවේ ක්‍රියාපද සම්බන්ධව කාලත්‍රයේ යෙදුනු වෙනස් ප්‍රත්‍යය රාශියක් හඳුනාගත හැකි වේ. එවා ඉහත විමර්ශනයෙහි දක්වා තිබේ.

නිදසුනක් ලෙස වර්තමාන සිංහල ව්‍යවහාරයෙහි ද මධ්‍යම පුරුෂ ඒකවචන හා බහුවචන සඳහා කාලත්‍රයේ භාවිත වනුයේ හි සහ හු යන ප්‍රත්‍යය දෙකය. එහෙත් පූර්වෝක්ත සියවස්වල දී අතීත කාල මධ්‍යම පුරුෂ ඒකවචන සඳහා /හි/, /ඒ/, /ඊ/ ප්‍රත්‍යයත්, බහුවචනය සඳහා /යු/, /හු/, /වහ/, /ඔ/, යනු ප්‍රත්‍යයත්, වර්තමාන කාල මධ්‍යම

පුරුෂ ඒකවචනය සඳහා /හි/ ප්‍රත්‍යයත්, බහුවචනය සඳහා /යු/, /වු/ ප්‍රත්‍යයත් භාවිත වී තිබේ.

විශේෂයෙන් සාමාන්‍ය වත්මන් සිංහල ව්‍යවහාරයෙහි මෙන්ම මෙම අවධිවල දී සිංහල භාෂාවේ වර්තමාන කාලික ක්‍රියාපද සකස් කරගැනීමේ දී ධාතු ප්‍රකෘතිය වෙනස් වීමකින් තොරව අවසන් ප්‍රත්‍යය එකතු වී තිබේ. ඇතැම් හල් අන්ත ධාතු ප්‍රකෘතිවලට ප්‍රත්‍යය එකතු වීමේ දී අන්ත හලන්ත ශබ්දය ද්විත්ව වී තිබේ. (ගන් + ඉ = ගන් + න් + ඉ = ගන්නි) නමුත් අතීත කාල ක්‍රියාපද සකස් කරගැනීමේ දී ධාතු ප්‍රකෘතියේ පළමු වර්ණයේ ස්වර පූර්වීකරණයට ලක්ව තිබේ. සීගිරි පද්‍යවල අනාගත කාල ක්‍රියාපද යෙදී තිබුන ද ඇතැම් අවස්ථාවල දී ඒවා වර්තමාන කාලික අර්ථයෙන් ම යෙදී තිබේ. ඇතැම් වර්තමාන කාල ක්‍රියාපද මුලට අනාගත කාල වාචී නිපාත යෙදීමෙන් අනාගත කාල අර්ථ සකස් කොටගෙන තිබේ. මේ අනුව පැහැදිලි වනුයේ මෙම අවධියෙහි සිංහල භාෂාවෙහි අනාගත කාලය දැක්වීම සඳහා වර්තමාන කාල ක්‍රියා පද සහ අනාගත කාලික ස්වරූපය ගැන්වූ ක්‍රියාපද යන කොටස් දෙකම යෙදී ඇති බවයි.

අනෙක් කරුණ නම් මෙම සීගිරි පද්‍ය ලියූවෝ අතර උගත්, නූගත් යන දෙපිරිසම සිට ඇත. එහි දී සාමාන්‍ය ජනයා විසින් ලියන ලද පද්‍යවල භාෂා ලක්ෂණ සැලකූ විට භාෂණ ව්‍යවහාරයට බර සාමාන්‍ය ස්වරූපයක් ද උගත් යැයි සැලකෙන පුද්ගලයන් ලියන ලද පද්‍යවල ලේඛනයට බර විදග්ධ ස්වරූපයක් ද හඳුනාගත හැකිය. ඒ අනුව මෙම පද්‍ය තුළ එවකට කථා ව්‍යවහාරයෙහි පැවති භාෂා ව්‍යවහාරය ද යෙදී ඇත යන්න ද අනුමාන කළ හැකිය.

මේ අනුව මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වනුයේ සීගිරි පද්‍යවල සඳහන් ක්‍රියාපද මඟින් සිංහල භාෂාවේ මධ්‍යතන අවධියට අයත් ක්‍රියාපදවල සංස්ථිතියෙහි විවිධතා පවතින අතර ඒවා ඉහත ආකාරයෙන් හඳුනාගත හැකි බවයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

කරුණාතිලක, ඩබ්. එස්. (2006). *භාෂා සමීක්ෂා.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කරුණාතිලක, ඩබ්. එස්. (2022) *සිංහල භාෂා ව්‍යාකරණය.* සීමාසහිත ඇම් ඩී ගුණසේන සහ සමාගම.

කොඩිකාර, ආර්. (2018). *සිංහල භාෂාව හා ව්‍යාකරණය.* සරසවි ප්‍රකාශකයෝ.

ගම්ලත්, එස්. (2000). *සීගිර කුරුටු ගී.* 1 වෙළුම. පුරාවිද්‍යා දෙපාරතමේන්තුව.

ජයතිලක, ඩී.බී. (1964). *සද්ධර්මරත්නාවලිය.* සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ඥාණවිමල හිමි, කේ. (1960) කාව්‍යශේඛරය. සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

තිලකසිරි, එස්. (2017). *ගුත්තිල කාව්‍ය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ධම්මරතන හිමි, î. (2014). *බාලාවතාර දීපනි.* සමයවර්ධන මුද්‍රණ ශිල්පියෝ.

පේමානන්ද හිමි, පී. (2004). *සිංහල භාෂාවේ පරිණාමය හා සිදත් සඟරාව.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මුදියන්සේ, එන්. (2004). *සීගිරි පද්‍යාවලිය.* දෙවන මුද්‍රණය. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සෝමාලෝකතිස්ස හිමි, කේ. (2014). *සිදත් සඟරා වියරණ විමසුම.* සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

Gunasekara, A.M. (2008). *Comprehensive Grammar of the Sinhalese Language*. S. Godage & Brothers (Pvt) Ltd.

Karunatillake, W.S. (2012). *Etymological lexicon of the Sinhala language*. S. Godage & Brothers (Pvt) Ltd.

Paranavitana, Senarat. (1956). *Sigiri Graffiti: Being Sinhalese Verses of the Eighth, Ninth, and Tenth Centuries*. Vol I. London: Oxford University Press for the Archaeological Survey of Ceylon

Paranavitana, Senarat. (1956). *Sigiri Graffiti: Being Sinhalese Verses of the Eighth, Ninth, and Tenth Centuries*. Vol II. London: Oxford University Press for the Archaeological Surv

The Journal of the Faculty of Humanities (JHU) (2025), Volume 33, Issue 1, 187-206
ISSN 1391-5096 (Print), ISSN 2783 – 8951 (Online)

# වාස්තුශාස්ත්‍රාගත මූලික ප්‍රමිති මානයන්හි විද්‍යමාන අංගුලයක පරිමාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඒ. එම්. ජී. ආර්. මධුශානි

## Abstract

Vāstuśatra is a scientific and practical science based on Indian attitudes.Accordingly, it is the Indian traditional system of house planning. The word Vāstu is derived from root "vās" which denotes living, housing. Historical evidence regarding Vāstuśatra are available even in among the Vedic scriptures. Vāstuśatra which is considered as *Upaveda* or subdivision of principle Vedic secret texts has been flourished by means of two traditions known as southern and Northern. Pioneers who represent both traditions have composed and published a number of vital texts on Vāstuśatra. *Mānasāra, Manuṣyālayacandrikā, Mayamata, Bṛhatsaṁhitā, Viśvakarmaprakāśa* and *Vāsturatnāvali* are well-known works which are scrutinized in this research process as the primary sources. Māna or measurement is a key principle in Vāstuśatra. *Aṁgula* is the one of main standard measurements of Vāstuśatra . There are different types of categorizations as *mānaṁgula, mātrāṁgula, dehalabdāṁgula* with reference to the standard of *Aṁgula*. Height, width and length of the house planning and so forth, all the units of measurements are

established based on this primary standard. But in the present context, individuals who are engaged in this domain do not have sufficient understanding. Even later scholars offer different definitions of the scale of an *Aṁgula.*Therefore, a number of misconceptions and miscalculations are being practiced. It is to be a displayable platform and example for the betterment of this subject domain. There is a gap in academic research on how to measure an *Aṁgula.* Qualitative research methods based on primary and secondary sources are used here. The main purpose of this is to investigate how the *Aṁgula* unit can be used practically in modern usage.

Key words; *Aṁgula*, *Architecture*, *Māna, Vāstuśāstra*

## හැඳින්වීම

වාස්තුශාස්ත්‍රයෙහි මූලාරම්භය සේ සලකනුයේ ශිල්පශාස්ත්‍ර ගණනාවක මාතෘභූමිය වන භාරතයයි. ශතවර්ෂ ගණනාවක සිට වාස්තුශාස්ත්‍රයෙහි ක්‍රමාභිවෘද්ධියට දක්ෂිණෝත්තර ගුරුකුල සම්ප්‍රදායන් මතින් පෝෂිත ශාස්ත්‍රීය මූලාශ්‍රය හේතු වී ඇත.

භාරතීය ගෘහනිර්මාණ ශිල්පයෙහි වැදගත් සෛද්ධාන්තික කොටසක් වශයෙන් 'මාන' නිර්ණය දැක් වේ. මිනිසා ගෘහනිර්මාණයට අත්පොත් තබන මුල් අවධියේ සිට ම මාන නිර්ණයට අනුගත වූ බවට සාධක හමු වේ. සමරාංගණ සූත්‍රධාරයට අනුව ඕනෑම නිර්මාණාත්මක ක්‍රියාකාරකමක් (ගොඩනැගිල්ලක් හෝ මූර්තිමය අංගයන්) මිනුම්වලින් සම්පූර්ණ විය යුතු වේ. මාන යනු මැනීමයි. අවමාන, අධිමාන යනාදි ව්‍යවහාර සමාජයෙහි දක්නට ලැබේ. මා යන සංස්කෘත ධාතුවෙන් මාන යන වචනය තැනේ.[1] මාන යන වචනයට විවිධ ශබ්දකෝෂාගත හා විශ්වකෝෂාගත අර්ථයන් වේ. අලගියවන්න පුවසති ශබ්දකෝෂයට අනුව ද මාන යනු මිනුම වේ.[2] මිනුම යන්න

1. Monier-williams, M. (1899). *A Sanskrit English Dictionary*. 80p. http://archive.org/details/in.ernet.dli.2015.31959
2. අලගියවන්න, පුවසති. (2004). *අලගියවන්න සංස්කෘත සිංහල ශබ්දකෝෂය.* සූරිය ප්‍රකාශන, කොළඹ 10. පි.624.

measurement, dimension යනුවෙන් ඉංග්‍රීසි ශබ්දකෝෂයන්හි විග්‍රහ වේ. මේ සඳහා විශ්වකෝෂාගත නිර්වචන පිරික්සීමේ දී ගොඩනැගිල්ලක් හෝ මූර්තියක් නිර්මාණය කිරීමේ දී භාවිත වන මිනුම් ක්‍රම පොදුවේ මාන ලෙස හැඳින්වේ.

බ්‍රහ්මණ්ඩ පුරාණය (vii පරිච්ඡේදය) මාන පිළිබඳ පැහැදිලි මූලාරම්භයක් ලබා දෙයි. මෙහි දී අංගුල හා හස්ත යන මිනුම් සම්මත මිනුම් ලෙස භාවිත වී ඇත. වාස්තුශාස්ත්‍රීය ග්‍රන්ථ බොහොමයක **'හස්ත ලක්ෂණ'** යනුවෙන් මෙකී මාන ක්‍රමයන් විස්තර කෙරේ. පුරාණ ග්‍රන්ථයන්හි සඳහන් වන පරිදි මුල්කාලීන මිනිසුන් ගුහා, කඳුකර ගංගා ආදි පාරිසරික අංගයන් මුල් කොටගෙන වාසය කර ඇත. සිසිලස හා තාපයෙන් මිදීමේ උපක්‍රමයක් ලෙස ඔවුහු නිවාස තැනීමට පටන් ගත්හ. ඉන්පසු ඔවුන් ඛේට(නගර), පුර(නිවාස), ග්‍රාම(ගම්), නගර(පුරවර) ඉදි කළහ. එහි දී ඔවුන්ගේ ජනවාසවල දිග, පළල, ජනාවාස දෙකක් අතර පරතරය මැනීමාදි කටයුතු සඳහා ඔවුහු සහජ ඥානයෙන් ම (යථා ඥානම්) තමන්ගේ ඇඟිලි යොදාගත්හ. එතැන් සිට අංගුල යන මිනුම ප්‍රමිතිකරණය වී ඇත.[3]

දක්ෂිණෝත්තර සම්ප්‍රදායට අයත් ශිල්පීය ග්‍රන්ථයන්හි මාන නිර්ණයට අදාළ සිද්ධාන්ත පිළිබඳ විශේෂතාවක් දක්වා ඇත. සෑම ඉදිකිරීමකට ම නිවැරදි මිනුම් යොදා ගැනීම එහි සමබරතාවට හේතු වේ. මුල්කාලීන භාරතීය සමාජය තුළ බිහි වූ වාස්තුශාස්ත්‍රයෙහි මිනුම් නිර්ණය කිරීමේ ක්‍රමවේදය ඉතා සුවිශේෂ වේ. ක්‍රමානුකූල ව මිනුම් ඒකකයන් නිර්මාණය කර ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ ව මූලාශ්‍රයන්හි සැකෙවින් තොරතුරු ඉදිරිපත් වේ. නමුත් වර්තමානයේ ඇතැම්හු ගැඹුරු අධ්‍යයනයකින් තොරව සාවද්‍ය මතවාද සමාජගත කරති. එහෙයින් විවිධ ගැටලු සහගත තත්ත්වයන් මතු ව ඇත. වාස්තුශාස්ත්‍රානුකූල ක්‍රමවේදයන්ට අනුව ඉදිකිරීම් සිදුකිරීමේ දී නිවැරදි මිනුම් ඒකකයන් යොදා ගැනීම සාර්ථක නිර්මාණ ක්‍රියාවලියකට මඟපාදයි. ඒ සඳහා මිනුම් ක්‍රමයන්හි මූලාරම්භය නියමාකාර ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණකි.

3. Acharya, P. K. (1981). *A dictionary of Hindu Architecture*. Oriental book reprint corporation, New Delhi,8p

## සාහිත්‍යය විමර්ශනය

උත්තර සම්ප්‍රදායට අයත් වරාහමිහිරාචාර්ය විසින් රචිත බෘහත්සංහිතාව, විශ්වකර්ම විසින් රචිත විශ්වකර්මප්‍රකාශය, දක්ෂිණ සම්ප්‍රදායට අනුගත මනු විසින් සම්පාදිත මානසාරය ආදි ග්‍රන්ථයන් මෙහිලා වැදගත් වේ. මේ සෑම ග්‍රන්ථයක් ම මුල්කාලීන යුගයන්හි රචනා වී ඇත්තේ සංස්කෘත භාෂාවෙනි. පසුකාලීන විද්වතුන් මේවායෙහි විවිධ සංස්කරණ සිදු කොට ඇත. එමෙන් ම මේවා මූලාශ්‍රය කරගෙන විවිධ පර්යේෂණයන් හා ග්‍රන්ථකරණයේ ද යෙදී ඇත.

වරාහමිහිරාචාර්ය විසින් බෘහත්සංහිතාව නම් වාස්තුශාස්ත්‍ර ග්‍රන්ථයක් රචනා කරන ලදී. මූල කෘතිය සංස්කෘත භාෂාවෙන් රචනා වී ඇත. එම සංස්කෘත භාෂාවෙන් ලියන ලද බෘහත්සංහිතාව සංස්කරණය කරමින් V. Subramanya sastri iy M. Ramakrishna Bhat යන වියතුන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර ඇත. මෙහි 53වන පරිච්ඡේදය වෙන් ව ඇත්තේ වාස්තුවිද්‍යා නමිනි. රජු, ඇමැති, පුරෝහිත, රාජ මහේෂි හා යුවරජ ආදි පුද්ගලයන්ගේ හා බ්‍රාහ්මණාදි චාතුර්වර්ණිකයන්ට අයත් ගෘහයන්හි පරිමාණ නිර්ණයට අදාළ සිද්ධාන්ත මෙහි විස්තර වේ. එම පරිමාණ නිර්ණයට අදාළ ව භාවිත වන මිනුම් ඒකකයන් පිළිබඳ ව ද විග්‍රහ කෙරේ.

1918 දී ප්‍රසන්න කුමාර් ආචාර්ය විසින් තම ආචාර්ය උපාධිය සඳහා කළ පර්යේෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් මානසාරයෙහි සංක්ෂේපයක් ඉදිරිපත් කෙරිණි. මානසාරයෙහි අන්තර්ගත කරුණු පරිච්ඡේදයෙන් පරිච්ඡේදයට ඉතා සංක්ෂිප්ත ව මෙහි ඉදිරිපත් කර ඇත. ඔහු නැවත 1933 දී සංස්කෘතයෙන් රචනා වී ඇති මානසාරය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර ඇත. වර්තමානයේ බොහෝ උගතුන්ගේ පරිශීලනයට ලක් වී ඇති මානසාරය මෙය වේ. මෙම ග්‍රන්ථයේ දෙවන අධ්‍යායේ මානක්‍රම හා එහි ආරම්භය පිළිබඳ විස්තර කරයි.

1998 දී Vibhuti Chakrabarti úiska Indian Architectural theory-Contemporary Uses of Vāstu Vidya නමින් ග්‍රන්ථයක් රචනා කර ඇත. විශේෂයෙන් සමරාංගණ සූත්‍රධාරය, රාජවල්ලභය, අපරාජිතපෘච්ඡා හා මානසාර ආදි වූ ශාස්ත්‍රීය ග්‍රන්ථ අධ්‍යයනය කරමින් ඒවායෙහි අන්තර්ගත ගොඩනැගිලි මූලධර්මවල පොදු ලක්ෂණ විමර්ශනය කිරීම

හා ඒවා යම් සැලසුම් පද්ධතියක් ලෙස සැලකීමට ඔහු මෙයින් උත්සහ කර ඇත. මෙම ග්‍රන්ථයේ දෙවන පරිච්ඡේදය මිනුම් ක්‍රම (System of Measurement) වශයෙන් වෙන් වෙයි. ඒ හරහා අවකාශය හා කාලය මැනීමේ මිනුම් ක්‍රම හා ආයාදි සූත්‍ර පිළිබඳ සංස්කෘත වාස්තුවිද්‍යා මූලාශ්‍රයාගත තොරතුරු ඉදිරිපත් කෙරේ. එමෙන් ම එම ග්‍රන්ථයන්හි සාපේක්ෂ ව ඉදිරිපත් වන මානක්‍රම හා ඒවායේ භාවිතය පිළිබඳ සාකච්ඡා කෙරේ.

D. N. Shukla විසින් වාස්තුශාස්ත්‍ර නමින් ග්‍රන්ථයක් රචනා කොට ඇත. ඔහු ස්වකීය ආචාර්ය උපාධිය වෙනුවෙන් කළ පර්යේෂණයේ ප්‍රතිඵලයක් වන Hindu science of Architecture එහි පළමු වෙළුමයි. එහි දෙවන වෙළුම වන්නේ Hindu canons of Iconography and painting වේ. මුල්කාලීන වාස්තුශාස්ත්‍රීය ග්‍රන්ථයන් හා අනෙකුත් ග්‍රන්ථයන් අධ්‍යයනය කරමින් ඒ පිළිබඳ ඔහු කරුණු ඉදිරිපත් කර ඇත. Hindu science of Architecture නම් පළමු වෙළුමෙහි පළමු කොටස වෙන් වන්නේ මූලික වාස්තුවිද්‍යාත්මක සිද්ධාන්ත (The fundamental canons) ඉදිරිපත් කිරීමටයි. එය පරිච්ඡේද VI න් යුක්ත වන අතර VI වන පරිච්ඡේදයේ මානෝපකරණ පිළිබඳ තොරතුරු විග්‍රහ වේ.

An encyclopedia of Hindu Architecture සහ A dictionary of Hindu Architecture නමින් භාරතීය වාස්තුශාස්ත්‍රයට අදාළ විශ්වකෝෂයක් හා ශබ්දකෝෂයක් P.K. Acharya විසින් රචනා කර ඇත. භාරතීය වාස්තුශාස්ත්‍රයට අදාළ පාරිභාෂික වචන, ඉදිකිරීම්, ප්‍රභවයන් ආදිය විවිධ මූලාශ්‍රයන්හි සංග්‍රහ වී ඇති ආකාරය අනුව මෙහි විස්තර සංග්‍රහ වේ. ප්‍රස්තුතයෙහිලා වැදගත්වන අංගුලය නම් මිනුම් ඒකකය පිළිබඳ තොරතුරු ගවේෂණයට මෙය වැදගත් වේ.

තිරුමංගලත් නීලකාන්ඨන් මූසාත් විසින් රචිත මනුෂ්‍යාලය චන්ද්‍රිකා නම් ශිල්ප ශාස්ත්‍රය ද ප්‍රස්තුතයෙහිලා අධ්‍යයනයට ලක් විය. සංස්කෘත භාෂාවෙන් රචිත මූල ග්‍රන්ථයෙහි පරිවර්තන හා සංස්කරණ පිටපත් කිහිපයක් හමු වේ. 1928 දී කොචි භාෂා පරිෂ්කරණ කමිටුව විසින් ප්‍රකාශයට පත් කරන ලද K. Parameshwara Menon විසින් මලයාලම් භාෂාවට පරිවර්තනය කරන ලද එක් අනුවාදයකි. එහි ශ්ලෝක 170ක් අඩංගු වන අතර එය පරිච්ඡේදවලට බෙදී නොමැත. 1998 දී P. Ramakrishnan විසින් කොචින් විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කරන ලද 'ගෘහනිර්මාණ ශිල්පයට අදාළ ඉන්දියානු ගණිතය

සහ කේරළයට විශේෂ අවධානයක් ඇති අනෙකුත් ප්‍රදේශ' යන මාතෘකාවෙන් යුත් ආචාර්ය උපාධි නිබන්ධනයේ උපග්‍රන්ථය වශයෙන් දේවනාගරී අක්ෂරයෙන් යුත් පිටපතක් හා ඉංග්‍රීසි භාෂාවට පරිවර්තිත පිටපතක් ද වේ. මෙහි පරිච්ඡේද 07කි. මීට අමතර ව Cheravalli Narayan Namboothiri විසින් මලයාලම් භාෂාවට පරිවර්තනය කරන ලද පිටපතක් හා ශ්‍රී ක්‍රිෂ්ණ ජුග්න විසින් හින්දි භාෂාවෙන් පරිවර්තනය කරන ලද කෘතියක් වේ. එමෙන්ම ආචාර්ය ඒ. අච්‍යුතන් හා ආචාර්ය බාලගෝපාල් ටී. එස්. ප්‍රභු යන අය විසින් මනුෂ්‍යාලය චන්ද්‍රිකාව අනුසාරයෙන් කරන ලද ඉංජිනේරුමය විවරණයක් ද හමු වේ. මෙහි භාරතීය මිනුම්හි ප්‍රාරම්භය හා සංවර්ධනය මෙන්ම විධිමත් මිනුම් නිර්ණය කිරීමේ ක්‍රියාවලියක් පිළිබඳ දැක්වේ.

International Journal for Research in Applied Science & Engineering – Technology (iJRASET) නම් සඟරාවෙහි පස්වන වෙළුම Prof. S. K. Gupta විසින් රචනා කරන ලද ලිපියක් වේ. Vāstuśāstra system – measurements and proportions යන මාතෘකාව යටතේ එය ඉදිරිපත් කර ඇත. මනුෂ්‍යාලය චන්ද්‍රිකාවෙහි විග්‍රහ වන අෂ්ට ගුණාකාර ව නිර්මාණය වන පරිමාණයන්හි ස්වාභාවය පිළිබඳ ව, මිනුම් ක්‍රමයන්හි ප්‍රභවය, ධාන්‍ය මත පදනම් ව ගොඩනැගෙන මිනුම් ක්‍රමවේදය හා ශරීරාංග මත පදනම් ව නිර්මාණය වන මිනුම් ක්‍රමයන්හි අන්තර් සබඳතාව පිළිබඳ එහි සැකෙවින් සාකච්ඡා කරයි.

B. Niranjan Babu විසින් රචනා කර ඇති Handbook of Vāstu නම් වාස්තුශාස්ත්‍රීය ග්‍රන්ථය ද වාස්තුශාස්ත්‍රීය මූලික ග්‍රන්ථයන් අධ්‍යයනය කොට සිද්ධාන්ත ඉදිරිපත් කෙරෙන ග්‍රන්ථයකි. මෙහි පළමු අධ්‍යායයේ නවවන කොටස වෙන් ව ඇත්තේ system of measurements යනුවෙනි.

## පර්යේෂණ ක්‍රමවේදය

ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයානුසාරී ව සිදු කෙරෙන ගුණාත්මක පරීක්ෂණ විධික්‍රමය (Qualitative methodology) මෙහිලා උපයුක්ත කොට ගැනේ. භාරතීය දක්ෂිණෝත්තර ගුරුකුලද්වය හරහා බිහි වූ ශිල්ප ග්‍රන්ථ රාශියකි. මයමතය, මානසාරය, විශ්වකර්ම ප්‍රකාශය, මනුෂ්‍යාලය චන්ද්‍රිකාදි ග්‍රන්ථ ඒ අතර වේ. මෙම ප්‍රාථමික හා ද්විතීයික ග්‍රන්ථ අනුසාරයෙන් භාරතීය මිනුම් ඒකකයන්හි ආරම්භය හා විකාශය පිළිබඳ අධ්‍යයනය කෙරේ. මෙම ක්ෂේත්‍රානුකූල ව

රචනා වී ඇති ලිපි ලේඛන හා සඟරා ආදිය ද පුස්තකාල හා අන්තර්ජාලය මගින් රැස් කොට අධ්‍යයනය කරනු ලැබේ. එතුළින් අංගුලයක පරිමාව සම්බන්ධයෙන් පවතින විවිධ තොරතුරු, මතවාද පරිශීලනයට මඟ පෑදේ. මෙකී ක්‍රමවේදයන් අනුසාරයෙන් භාරතීය අංගුලයක පරිමාණය මූලාශ්‍රයනුසාරීව ගවේෂණයත් නූතනයට එය භාවිත කළ හැකි ප්‍රායෝගික ආකාරයත් අධ්‍යයනය කෙරේ.

## පර්යේෂණ ප්‍රතිඵල

වාස්තුශාස්ත්‍රයෙහි මාන ඒකකයන් අධ්‍යයනයේ දී මූලික ඒකකය වශයෙන් අංගුල හමු වේ. අංගුලයක් යනු ඇඟිල්ලක පළල ප්‍රමාණය (A finger breadth) බව ශබ්දකෝෂාගත අර්ථය වේ.[4] බ්‍රිතාන්‍ය මිනුම් ඒකකයන්ට අනුව එය ¾ අඟල් (0.75”) ක ප්‍රමාණය බව දැක්වේ.[5] අංගුල පරිමාවට අදාළ ප්‍රධාන ප්‍රභේදත්‍රයක් පිළිබඳ මානසාරයෙහි විස්තර වේ.

- මානාංගුල
- මාත්‍රාංගුල
- දේහලබ්ධාංගුල[6] වශයෙන් එය හඳුනාගත හැකිය.

### යව මානය හා අංගුල

වාස්තුශාස්ත්‍ර මූලාරම්භයෙහි මිනුම් නිර්ණයාදි කටයුතු සඳහා යව ධාන්‍ය ප්‍රමිතිකරණය වී ඇත. නූතනයේ බාර්ලි වශයෙන් ව්‍යවහාර වන්නේ යව ධාන්‍ය වේ.[7] යව ඇට අටක ප්‍රමාණය අංගුලයක ප්‍රමාණයට සමාන වේ.

පරමාණු, රථධූලි, කෙසඟ, ලික්ෂා, යූකා හා යව යන ඒකකයන්හි අෂ්ට ගුණාකාර වර්ධනයෙන් අංගුලයක ප්‍රමාණය නිර්මාණය වේ.[8]

---

4. Acharya, P. K. (1981). *A dictionary of Hindu Architecture*. Oriental book reprint corporation, New Delhi,5p
5. Acharya, P. K. (1978). *An encyclopedia of hindu architecture*. Bhopal: J.K. Pub. House,11p
6. Acharya, P. K. (1981). *A dictionary of Hindu Architecture*. Oriental book reprint corporation, New Delhi,6p
7. www.wisdomlib.org. (2009, April 12). *Yava, Yāva: 39 definitions*. https://www.wisdomlib.org/definition/yava
8. Acharya, P. K. (1981). *A dictionary of Hindu Architecture*. Oriental book reprint corporation, New Delhi,5p

ඒ අනුව කුඩාම ඒකකය පරමාණුව වේ. මනුෂ්‍ය මසැසින් දැකගත නොහැකි වූ යොගීෂ්වර පුරුෂයන්ට දිවැසින් දැකගත හැකි වූ ඉතා ම කුඩා අංශු ප්‍රමාණය පරමාණුවක් බව වාස්තුශාස්ත්‍රයේ විග්‍රහ වේ. නූතන විග්‍රහයන්ට අනුව පරමාණුවක් යනු යම් මූලද්‍රව්‍යයක ඇති, එම මූලද්‍රව්‍යයේ රසායනික ගුණ දරන ප්‍රෝටෝන, නියුට්‍රෝන හා ඉලෙක්ට්‍රෝන යන උපපරමාණුක අංශුවලින් සැදුම්ලත් කුඩාම අංශුවයි[9]. ගෘහයක දැල් කවුළුවක සිදුරක් මතින් වැටෙන සූර්ය රශ්මියෙහි යම් රජස් භ්‍රමයක් වී නම් ඉන් එකක් පරමාණු 08ක ප්‍රමාණය වන බව වාස්තුශාස්ත්‍රයෙහි තවදුරටත් විස්තර වේ. ඒ අනුව පරමාණු 08ක් රජස් හෙවත් රථ ධූලි එකකි. එයින් 08ක් කෙසඟ එකකි. කෙසඟ අටක් ලික්ෂා එකකි. ලික්ෂා යනු ලෙහෙඬියෙකි. ලික්ෂා අටක් යූකා එකකි. යූකා යනු උකුණෙකි. යූකා අටක ප්‍රමාණය යව ඇටයක ප්‍රමාණයට සමාන වේ. නූතනයේ බාර්ලි වශයෙන් ව්‍යවහාර වන්නේ යව ධාන්‍ය වේ. යව ඇට අටක ප්‍රමාණය අංගුලයක ප්‍රමාණයට සමාන වේ.

පරමාණුවෙන් ආරම්භිත අංගුලයක ප්‍රමාණය පිළිබඳ මනුෂ්‍යාලයචන්ද්‍රිකාවෙහි ද හමු වේ.[10]

| | | |
|---|---|---|
| පරමාණු 8 | = | ත්‍රසරේණු (රථධූලි) 1 |
| ත්‍රසරේණු 8 | = | ලික්ෂා 1 |
| ලික්ෂා 8 | = | යූකා 1 |
| යූකා 8 | = | තිල 1 |
| තිල 8 | = | යව 1 |
| යව 8 | = | අංගුල 1 |

මෙම අංගුලයෙහි ප්‍රභේදත්‍රයක් පිළිබඳව ද සාකච්ඡා වේ.

- යව ඇට අටින් වර්ධිත අංගුල
- යව ඇට සතෙන් වර්ධිත අංගුල
- යව ඇට හයෙන් වර්ධිත අංගුල වශයෙනි.[11]

---

9. *Atom*. (n.d.). Oxford Reference. https://doi.org/10.1093/oi/authority.20110803095432229
10. Achyuthan, A., & Prabhu, B. T. S. (1998). *Manusyalayacandrikabhasyam =: An engineering commentary on Manuṣyālayacandrika of Tirumangalat Nīlakaṇthan Mūsat*. Kiliyanad, Calicut: Vastuvidyapratisthanam, 86p
11. අප්පුහාමි, හර්මානිස්, වයි.ඒ. (2017) *වාස්තුවිද්‍යාව හෙවත් ගෘහනිර්මාණ ශිල්පය*, ගුණසේන සහ සමාගම, කොළඹ. 53 පිටුව

එයින් යව ඇට අටෙන් වර්ධිත අංගුල උත්තම වන අතර යව ඇට සතෙන් වර්ධිත අංගුල මධ්‍යම වේ. යව ඇට හයෙන් වර්ධිත අංගුල අධම ගණයට අයත් වේ. සාමාන්‍ය ගෘහකරණයේ දී මින් භාවිත කළ යුත්තේ යව ඇට අටින් වර්ධනය වන මිනුම් ඒකකය බව වාස්තු නියමය වේ.

## අංගුලයෙහි වර්ධිත අවස්ථාවන්

භාරතීය ගෘහනිර්මාණ ශිල්පයේ මූලික ඒකකයක් වන අංගුලයෙහි ක්‍රමානුකූල වර්ධිත අවස්ථා හඳුන්වන පාරිභාෂික නාමයන් පිළිබඳ සඳහනක් ද වේ.[12]

වගු සටහන 1 : අංගලයෙහි වර්ධිත අවස්ථා I

| අංගුල ප්‍රභේද | පාරිභාෂික නාම |
|---|---|
| අංගුල 01 | මාත්‍රා (*mātrā*) |
| අංගුල 02 | කලා (*kalā*) |
| අංගුල 03 | පර්වන් (*parvan*) |
| අංගුල 04 | මුෂ්ටි (*muṣṭi*) |
| අංගුල 05 | තල (*tala*) |
| අංගුල 06 | කර පාද (*kara pāda*) |
| අංගුල 07 | දෘෂ්ටි (*dṛṣṭi*) |
| අංගුල 08 | තූණි (*tūṇi*) |
| අංගුල 09 | ප්‍රාදේශ (*prādeśa*) |
| අංගුල 10 | සය තාල (*saya tāla*) |
| අංගුල 11 | ගෝ කර්ණ (*go - karṇa*) |
| අංගුල 12 | විතස්ති (*vitasti*) |
| අංගුල 14 | අනාහ පාද (*anāha pāda*) |
| අංගුල 21 | රත්නි (*ratni*) |
| අංගුල 24 | අරත්නි (*aratni*) |
| අංගුල 42 | කිෂ්කු (*ki ṣku*) |

12. Acharya, P. K. (1981). *A dictionary of Hindu Architecture*. Oriental book reprint corporation, New Delhi,7p

| | |
|---|---|
| අංගුල 84 | පුරුෂ (*puru ṣa*) |
| අංගුල 96 | ධනු (*dhanus*) |
| අංගුල 106 | දණ්ඩ (*daṇḍa*) |

අංගුලයෙහි වර්ධිත අවස්ථාවන් සඳහා යෙදෙන පාරිභාෂිකයන් පිළිබඳ තවත් එක් වර්ගීකරණයක් ද හමු වේ.[13]

වගු සටහන 2 :අංගුලයෙහි වර්ධිත අවස්ථා II

| අංගුල ප්‍රභේද | පාරිභාෂික නාම |
|---|---|
| අංගුල 01 | බින්දු, මෝක්ෂ |
| අංගුල 02 | කලා, කෝලක, පද්ම, අක්ෂි, අශ්විනී. |
| අංගුල 03 | රුද්‍රාක්ෂි, අග්නි, ගුණ, ශූල, විද්‍යා |
| අංගුල 04 | රුද්‍රාණන, ඉන්ද්‍රිය, භූත, |
| අංගුල 05 | යුග, භාග, වේද, තුරිය |
| අංගුල 06 | කර්මන්, අංග, අයන, රස |
| අංගුල 07 | පාථාල, මුනි, ධාතු, අබ්ධි |
| අංගුල 08 | භසු, ලෝක, මූර්ති |
| අංගුල 09 | ද්වාර, සූත්‍ර, ග්‍රහ, ශක්ති |
| අංගුල 10 | දිශ්, නාඩි, ආයුධ, ප්‍රාධුර්භව |
| අංගුල 20 | ත්‍රිෂු, විෂ්කු |
| අංගුල 30 | ගති |
| අංගුල 40 | ත්‍රිගත් |
| අංගුල 50 | ශක්වරී |
| අංගුල 60 | අධිශක්වරී |
| අංගුල 70 | යෂ්ටි |
| අංගුල 80 | අත්යෂ්ටි |
| අංගුල 90 | ධෘති |
| අංගුල 100 | අතිධෘති |

13. Acharya, P. K. (1981). *A dictionary of Hindu Architecture*. Oriental book reprint corporation, New Delhi,10p

## මානාංගුලය

යව ධාන්‍ය මත පදනම් ව අංගුලයක පරිමාව ගණනය කිරීමේ දී එය මානාංගුලය වශයෙන් ව්‍යවහාර වෙයි. එනම් මානාංගුලය වශයෙන් දැක්වෙන්නේ ද යව ඇට අටකින් සැදුම්ලත් ඒකකයයි.[14]

මානාංගුලය පිළිබඳ විවිධ මතවාද පවතී. මනු, මය, ත්වෂ්ට්‍ර හා විශ්වකර්ම යන ඍෂිවරුන් සතර දෙනෙකු විසින් චතුර්විධ මානශාස්ත්‍රයක් ඉදිරිපත් කෙරේ. මානාංගුල විධිය පිළිබඳ ඔවුන් දක්වන එකී මත එකිනෙකට සමාන නොවේ. ප්‍රභේද වශයෙන් මනු විසින් මානාංගුල ත්‍රිත්වයක් දක්වා ඇත. මය ඍෂිවරයා ද විශ්වකර්ම ඍෂිවරයා ද මානාංගුල ප්‍රභේදත්‍රයක් පිළිබඳ ඉදිරිපත් කොට ඇත. ත්වෂ්ට්‍ර ඍෂිවරයා විසින් මානාංගුයට අදාළ ප්‍රභේද 06ක් ඉදිරිපත් කර ඇත.

**01. මනුමතය**

මනු ඍෂිවරයා විසින් ඉදිරිපත් කර ඇති මානාංගුල ප්‍රභේද ත්‍රිත්වය පහත අයුරෙන් හඳුනාගත හැකිය.

i. අට ලෙනක්
ii. සත් ලෙනක්
iii. ෂඩ් ලෙනක්[15]

**02. මයමතය**

මය ඍෂිවරයා දක්වන මයමත නම් මාන ශාස්ත්‍රයෙහි ද මානාංගුලයෙහි ප්‍රභවය පරමාණු, රථධූලි, කෙසඟ, ලික්‍ෂා, යූකා හා යව යන ඒකකයන්හි අෂ්ට ගුණාකාර වර්ධිතයන් අනුව නිර්මාණය වේ. ඔහු දක්වන මානාංගුලය ඍජුව ම යව ඇට ප්‍රමාණය මත තීරණය වේ. එනම්,

i. යව ඇට අටකින් සැදුම්ලත් මානාංගුලය
ii. යව ඇට හතකින් සැදුම්ලත් මානාංගුලය
iii. යව ඇට හයකින් සැදුම්ලත් මානාංගුලය වශයෙනි.[16]

---

14. Ibid,6p
15. මුදියන්සේ, නන්දසේන. (1983). *වෛජයන්ත තන්ත්‍රය.* කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය. පි. 3-4ච
16. එම, පි. 4p

**03. ත්වෂ්ට්‍රමතය**

ත්වෂ්ට්‍ර විසින් ඉදිරිපත් කරන ලද මාන ශාස්ත්‍රයෙහි මානාංගුල ප්‍රභේද ෂට්කය මෙසේ ය.

i. යව මධ්‍ය පළල 8
ii. යව මධ්‍ය පළල 7
iii. යව මධ්‍ය පළල 6
iv. ශාලි දිග 3
v. ශාලි දිග 3 ½
vi. ශාලි දිග 4 [17]

යව හා ශාලි ධාන්‍යයන්හි පරිමාව මත මානාංගුලයෙහි ප්‍රභේද 06ක් ත්වෂ්ට්‍ර විසින් ඉදිරිපත් කර ඇති බව මෙහි දී හඳුනාගත හැකි ය.

**04. විශ්වකර්ම-මතය**

ඉහතින් සාකච්ඡා කළ මනු, මය හා ත්වෂ්ට්‍ර ඍෂිවරුන්ගේ මානශාස්ත්‍ර ඍජුව ම ධාන්‍ය පරිමාවන් මත වර්ග කොට ඇත. නමුත් විශ්වකර්ම විසින් ඉදිරිපත් කර ඇති මාන ශාස්ත්‍රයෙහි මනුෂ්‍ය ශරීර අංග මත පදනම් ව විග්‍රහ කෙරේ. විශ්වකර්ම-මතයට අනුව පුරුෂයෙකුගේ දකුණතෙහි මැද පුරුකක දිග ප්‍රමාණය මානාංගුලයක් වශයෙන් ගණනය කෙරේ. එය පදනම් කරගනිමින් එහි

i. කොටස් 08න් යුක්ත ඒකකය
ii. කොටස් 07න් යුක්ත ඒකකය
iii. කොටස් 06න් යුක්ත ඒකකය[18]

වශයෙන් වර්ගත්‍රය විස්තර කෙරේ.

## යජමානය හා අංගුල

මනුෂ්‍ය ශරීර අංග මත පදනම් වී ගොඩනැගී ඇති මිනුම් ක්‍රමවේදය යජමානය ලෙස හඳුනාගත හැකිය. අංගුලයක පරිමාව මනුෂ්‍ය ශරීර අංග මත පදනම් ව ගණනය කෙරෙන අවස්ථාවන්හි

17. එම, පි. 4p
18. මුදියන්සේ, නන්දසේන. (1983). *වෛජයන්ත තන්ත්‍රය*. කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය. පි. 4

එය මාත්‍රාංගුලය වශයෙන් ව්‍යාවහාර කෙරේ[19]. උත්තම පුරුෂයෙකුගේ දකුණතෙහි මැදඟිල්ලේ මැදපුරුකක ප්‍රමාණය මාත්‍රාංගුලයක් වන බව වාස්තු නිර්දේශය වේ. එය මහේශ්වර අංගුල, විෂ්ණු අංගුල හා බ්‍රහ්ම අංගුල වශයෙන් වර්ගත්‍රයකි.

යජමානය පිළිබඳ අධ්‍යයනයේ දී එහි ද ප්‍රභේද කිහිපයක් පිළිබඳ සාක්‍ෂ්‍ය හමු වේ.[20]

## 01. ද්වියජමාන ප්‍රභේදය

i. ප්‍රාථමික අංගුල
පරමාණුව ඒකකයෙන් ආරම්භ වන පරිමාණ ගණනය ප්‍රාථමික අංගුල වශයෙන් සැලකේ. අංගුල යන වචනාර්ථයෙහි ම සඳහන් වන්නේ ඇඟිලි යන අදහසයි. ඒ අනුව පරමාණුවෙන් ඇරඹී අෂ්ට ගුණාකාර ව වර්ධනය වන ඒකකයන්හි යව ඇට අටක ප්‍රමාණය ඇඟිලි පුරුකක ප්‍රමාණයට සමාන වේ.

ii. කර්තෘමාත්‍රාංගුලය
ඉදිකිරීම් කටයුතු සිදුකරන්නාගේ හස්තයෙන් ලබා ගන්නා අංගුලක පරිමාව වේ.

## 02. ත්‍රිවිධයජමාන ප්‍රභේදය

i. දේහලබ්ධාංගුලය
මූර්ති ශිල්පයේ දී භාවිත වන මිනුම් ඒකකයකි. පිළිමයක උස ගණනයේ දී සමාන කොටස් කිහිපයකට අනුරූපී ව උස ගණනය කරනු ලැබේ. එම සමාන කොටස්වලින් එක් කොටසක් දේහලබ්ධාංගුල වශයෙන් හැඳින් වේ. මේ සඳහා අංශ යන යෙදුම ද යෙදේ.

---

19. Acharya, P. K. (1981). *A dictionary of Hindu Architecture*. Oriental book reprint corporation, New Delhi,6p

20. මුදියන්සේ, නන්දසේන. (1983). *වෛජයන්ත තන්ත්‍රය*. කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය. පි. 10-11

ii. හස්තමානාංගුල
පුරුෂයෙකුගේ දක්ෂිණ හස්තයෙහි ප්‍රමාණය අනුව නිර්ණය කරගනු ලබන මාන ඒකකය වේ. මෙය උත්තම, මධ්‍යම හා හීන වශයෙන් වර්ගත්‍රයකි. හස්තයකට වියත් දෙකකි. වියත වශයෙන් ගණනය වන්නේ මණිබන්ධයේ පටන් මධ්‍යමාංගුලිය දක්වා අත්ලක ප්‍රමාණයයි. එය අඟල් 12ක ප්‍රමාණය වේ. ඒ අනුව හස්තයක් යනු අඟල් 24ක් වන අතර හස්තමානාංගුලය වශයෙන් ගැනෙන්නේ ඉන් 1/24 කි.

iii. මධ්‍යමානාංගුල
හස්තයක මැදගිල්ලේ මැද පුරුකක ප්‍රමාණය මධ්‍යමානාංගුලය වශයෙන් ව්‍යවහාර වේ. මෙම මධ්‍යමානාංගුලය හා දේහලබ්ධාංගුලයක ප්‍රමාණය එක හා සමාන බව දැක්වේ.

## 03. චතුර්යජමාන ප්‍රභේදය

මෙම ක්‍රමවේදය ඔස්සේ ඍජුව ම හස්තයක ප්‍රමාණය ගණනය කෙරෙන ආකාර 04ක් විග්‍රහ කෙරේ. හස්තයක ප්‍රමාණය ගණනය කිරීම පිළිබඳ විවිධ මතවාද පවතින අතර මෙම ක්‍රමවේදය ඒ අතර ප්‍රචලිත වේ.

i. සුළඟිල්ලේ සිට බාහු මූල සන්ධිය දක්වා

ii. වෙදඟිල්ලේ සිට බාහු මූල සන්ධිය දක්වා

iii. මැදඟිල්ලේ සිට බාහු මූල සන්ධිය දක්වා

iv. දබරඟිල්ලේ සිට බාහු මූල සන්ධිය දක්වා[21]

වශයෙන් පුරුෂයෙකුගේ අතෙහි ඇඟිලිවල සිට බාහු මූලය දක්වා වූ දුර ප්‍රමාණය මත මිනුම් ගණනය කිරීමේ ක්‍රමවේදක් යජමානය යටතේ මෙපරිදි විග්‍රහ වේ. මෙහි දී ඒ ඒ ඇඟිලි අග්‍රයේ සිට බාහුවේ මුල දක්වා වන ප්‍රමාණය කොටස් 24ට බෙදීමෙන් අඟලක පරිමාණ තීරණය කරනු ලැබේ.

21. මුදියන්සේ, නන්දසේන. (1983). *වෛජයන්ත තන්ත්‍රය*. කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය. පි. 11

මේ අයුරෙන් මනුෂ්‍ය ශරීරාංග මත පදනම් ව ගොඩනැගී ඇති යජමාන ප්‍රභේද 09ක් තත්වාකාරයෙන් හඳුනාගැනීමට හැකිය.

භාරතීය ගෘහනිර්මාණ ශිල්පශාස්ත්‍ර අතර මාන නිර්ණයේ දී මේ අයුරින් අංගුල යන ඒකකය සඳහා ප්‍රමුඛත්වයක් දී ඇති බැව් පෙනේ.

## සමාලෝචනය

### මානාංගුලය හා ඉංග්‍රීසි අඟල

වාස්තුශාස්ත්‍රාගත අංගුල හා මෙට්‍රික් ඒකකයට අනුව අඟලක පරිමාව අතර විද්‍යමාන විෂමතාව මෙහි දී හඳුනාගත හැකි ය. වාස්තුශාස්ත්‍රයෙහි අංගුල හෙවත් මානාංගුල ඒකකය සඳහා ඉංග්‍රීසී ව්‍යවහාරයෙහි Inch යන්න ද සිංහල ව්‍යවහාරයෙහි අඟල යන්න ද යෙදේ. නූතන විචාරකයන්ට අනුව වාස්තුශාස්ත්‍රාගත අංගුලයක ප්‍රමාණය 3'75cm කි.[22]

පළමු මතය

**අංගුලයක්(මානාංගුලයක්) = ඉංග්‍රීසි අඟල් (Inch) 01**

වගු සටහන 3: අංගුල හා inch

| වාස්තු ක්‍රමවේදය | මෙට්‍රික් ක්‍රමවේදය |
|---|---|
| අංගුල 1 ^3.75 x 8& | Inch 1 |
| 30mm | 25mm |
| 3cm | 2.5cm |
| ↓ නූතන අඟල්වලට පරිවර්තනය | ↓ |
| 1.18” | 0.98” |
| 1”(ආසන්නව) | 1”(ආසන්නව) |

22. Achyuthan, A., & Prabhu, B. T. S. (1998). *Manusyalayacandrikabhasyam =: An engineering commentary on Manuṣyālayacandrika of Tirumangalat Nīlakaṇṭhan Mūsat*. Kiliyanad, Calicut: Vastuvidyapratisthanam, 87p

ඉහත සටහනට අනුව වාස්තුශාස්ත්‍රාගත අංගුලයක් හා ඉංග්‍රීසි අඟල් (Inch) එකක් අතර ඇති වෙනස අවබෝධ කරගත හැකි ය. මෙට්‍රික් ක්‍රමවේදයේ පවතින Inch එකකට වඩා සුළු ප්‍රමාණයකින් **අංගුලයක** පරිමාණය විශාල ය. නමුත් ආසන්න වශයෙන් සැලකීමේ දී ඒකකද්වය ම නූතන අඟල් 1ට සමාන වේ. මෙලෙස භාවිත කිරීම සෙසු ගණනය කිරීම්වල දී ද පවතින ගැටලුකාරී තත්වයන් විසඳා ගැනීමට උපකාරී වේ.

දෙවන මතය

**අංගුලයක් (මානාංගුලයක්) = ඉංග්‍රීසි අඟල් (Inch) ¾**

ඉහතින් දැක් වූ ක්‍රමවේදයට වඩා පරස්පර ක්‍රමවේදයක් ද හමු වේ. ඇතැම් විචාරකයන් මෙලෙස ඉදිරිපත් කරනුයේ වාස්තුශාස්ත්‍රයේ දැක්වෙන හස්ත මාන ඒකකය මත පදනම් වෙමිනි.

වගු සටහන 4: හස්තයෙහි ව්‍යවහාර

| වාස්තුශාස්ත්‍රයෙහි | ඉංග්‍රීසි ව්‍යවහාරය | සිංහල ව්‍යවහාරය |
|---|---|---|
| හස්ත | Cubit | රියන |

වශයෙන් ඒ ඒ තැන්හි විවිධ ව්‍යවහාරිත අර්ථයන් දැක්විය හැකි ය. මෙහි ඒකකයන්හි නිර්මාණය පහත පරිදි විග්‍රහ කළ හැකි ය.

වගු සටහන 5: හස්ත ප්‍රමාණය මත අංගුලක පරිමාව

| වාස්තු ක්‍රමවේදය | මෙට්‍රික් ක්‍රමවේදය |
|---|---|
| හස්ත | Cubit |
| අංගුල 24 | 18 inch |
| 24/24 | 18/24 |
| අංගුල 01 | 0.75 inch<br>(¾ inch) |

හස්තයක් යනු අඟල් 18ක් යන න්‍යාය අනුගමනය කරමින් එයින් 1/24 ක් අඟලක් සේ ගෙන මෙම ගණනයන් සිදු කොට ඇත.

නමුත් පළමු මතයට අනුව යමින් හස්තයකට අඟල් 18ක් ලෙස යොදා ගැනීම යුක්ති සහගත නොවේ.

වගු සටහන 6: හස්තය හා cubit ඒකකයේ අසමානත්වය

| වාස්තු ක්‍රමවේදය | මෙට්‍රික් ක්‍රමවේදය |
|---|---|
| හස්ත (අංගුල 24) | Cubit (18 inch) |
| 3cm x 24 | 2.54 x 18 |
| 72cm | 48.75cm |

හස්තයක් යනු අංගුල 24ක් බව වාස්තු නියමය වේ. නූතන ගණනය කිරීම්වලට අනුව එය 72cm ක් වේ.

නමුත් මෙට්‍රික් ඒකකයන් අනුව Cubit එකක් යනු අඟල් 18ක ප්‍රමාණය වේ. ඒ අනුව සැලකීමේ දී 45'72cmක් ප්‍රමාණය වේ. වාස්තුශාස්ත්‍රීය හස්තය හා මෙට්‍රික් ක්‍රමවේදයේ Cubit ඒකකය අතර පැහැදිලි පරස්පරතාවක් මේ අනුව විශද වේ.

ඉහතින් සාකච්ඡා කළ පරිදි ඉංග්‍රීසි ක්‍රමවේදයෙහි Inch යන ඒකකය අංගුල ඒකකයට සමාන වශයෙන් ගන්නේ නම්, මෙය පැහැදිලි ව නිරාකරණය වේ.

I inch = 2.54cm
= 2.54 x 24
= 60cm

↓ නූතන අඟල්වලට පරිවර්තනය කිරීම

= 23.6 inch
= 24 (ආසන්නව)

## නිගමනය

මාන ක්‍රමයන්හි මූලාරම්භය පිළිබඳ අධ්‍යයනයේ දී ධාන්‍ය මත පදනම් ව ගොඩනැගී ඇති 'යවමාන' ක්‍රමවේදයත් ශරීරාංග මත ගොඩනැගී ඇති මිනුම් ක්‍රමවේදයක් ද වේ. එය මෙහි දී 'යජමාන'

වශයෙන් පෙන්වා දීමෙන් මිනුම් නිර්ණය ක්‍රියාවලියේ ප්‍රායෝගික පැතිකඩ පිළිබඳ සාකච්ඡා කෙරේ. පරමාණුව නම් ඉතා කුඩා අංශු ප්‍රමාණයක සිට අෂ්ට ගුණාකාර ව වර්ධනය වන මිනුම් නිර්ණය කිරීමේ ක්‍රියාවලියක් භාරතීය වාස්තුශාස්ත්‍රය කෙරෙන් විද්‍යමාන වේ. එලෙස ප්‍රාරම්භ වන මානයන්හි අංගුලය හා හස්තය යන ඒකකද්වය භාරතීය ශිල්පශාස්ත්‍ර තුළ ප්‍රමිතිකරණය වී ඇත.

නූතනයේ අඟල වශයෙන් ව්‍යවහාර වන අංගුලය නම් භාරතීය ඒකකද්වයෙහි නියම පරිමාණය පිළිබඳ වාස්තුශාස්ත්‍රීය මූලාශ්‍රය, ශබ්ද කෝෂාගත අර්ථ නිරූපණයන් පරීක්ෂාවට ලක් විය. ඒ අනුව ආකාර දෙකක් ඔස්සේ අංගුලයක පරිමාණය නිර්ණය කළ හැකි ය. යවමාන ක්‍රමවේදය ඉන් එකකි. මුල් කාලීන භාරතීය ජන සමාජය තුළ කෘෂිකාර්මික ජීවන රටාව ප්‍රමුඛ ව පැවතීම නිසා මිනිසුන් ස්වභාවික පරිසරයේ පවතින ද්‍රව්‍ය මිනුම් නිර්ණයාදි කටයුතු උදෙසා භාවිත කොට ඇත. ඒ අනුව පසුකාලීන ව යව ධාන්‍ය සම්මත මිනුම් ඒකකයන් ගොඩනැගීම සඳහා භාවිත වී ඇත. එහි දී යව ඇට අටක ප්‍රමාණය අංගුලයක් වශයෙන් නියම වී ඇති බැව් පෙනේ. යව ඇටයක නිශ්චිත පරිමාව පිළිබඳ ඇතැම් පුද්ගලයන්ට පැනයක් ඇති විය හැකි ය. විවිධ ප්‍රදේශයන්හි විවිධ කාලගුණික දේශගුණික විපර්යාස හමුවේ. විවිධ භූවිෂමතාවන් තුළ භෝග වර්ධනය විවිධ පරිමාණයෙන් වෙනස් විය හැකි ය.

මනුෂ්‍යාලයචන්ද්‍රිකා සඳහා පසුකාලීන විද්වතුන් කරන ලද සංස්කරණයන්හි යව ධාන්‍යක ප්‍රමාණය නූතන මිනුම් අනුව සැලකීමේ දී 3.75mm ක් බව දක්වයි. එම නියමය මත පදනම් ව ක්‍රමානුකූල ව අංගුලයක පරිමාව නිර්ණය කළ හැකි ය.

අංගුලයක පරිමාව පිළිබඳ අධ්‍යයනයේ දී නූතන විචාරකයන් එය ඉංග්‍රීසි මිනුම් ඒකකයන්ට ආදේශ කිරීමට පෙළඹීම නිසා වර්තමානය වන විට ඒ පිළිබඳ ආන්දෝලනාත්මක තත්ත්වයක් පවතී. භාරතීය අංගුලය හා ඉංග්‍රීසි ඒකකයන්හි Inch යන ඒකකය මෙහි දී සමාන කිරීමට යත්න දැරීමත් නිසා විවිධ මතවාද ගොඩනැගී ඇත.

මෙට්‍රික් ක්‍රමවේදය තුළ පවතින Inch 1 ට වඩා සුළු ප්‍රමාණයකින් වාස්තු ක්‍රමවේදයෙහි අංගුලයක ප්‍රමාණය විශාල වේ. නමුත් ආසන්න වශයෙන් සැලකීමේ දී ක්‍රමවේද දෙකෙහි ම එය අඟල් 01ට සමාන

වේ. එහෙයින් මෙම පර්යේෂණයේ දී භාරතීය අංගුලයක පරිමාව නූතන අඟල් (Inch 1) එකක් වශයෙන් ම ආදේශ කරගත යුතු බව අවධාරණය කෙරේ. එහි ප්‍රායෝගික බව ද මෙහි දී ඉදිරිපත් කෙරේ.

මෙම පර්යේෂණයේ දී භාරතීය අංගුලය වෙත නූතන ඉංග්‍රීසි ඒකක ආදේශ කිරීමත් ඇතැම් සාවද්‍ය පරිවර්තන කාර්යයන් ඍජු ව බලපෑම් ඇති කරන බව තහවුරු වේ. එහෙයින්,

භාරතීය අංගුලය = නූතන අඟල් 1

ලෙස භාවිතයට ගැනීම ම වඩා යෝග්‍ය හා ප්‍රායෝගික බැව් ඉදිරිපත් කෙරේ.

අංගුලයක පරිමාණය පිළිබඳ සමාජගත විවිධ මතවාද සාකච්ඡා කෙරිණි. පෙරදිග හා අපරදිග භාවිත මිනුම් ක්‍රමයන් අවබෝධයෙන් තොරව භාවිත කිරීමෙන් ශාස්ත්‍රීය සිද්ධාන්ත අතර දුර්මත ගොඩනැගෙනු ඇත. යථෝක්ත සාධක අනුව අංගුලයක පරිමාව නූතන ඉංග්‍රීසි අඟල් 1ක් වශයෙන් යොදාගැනීම ප්‍රඥාගෝචර වේ. එලෙස යොදාගැනීම මිනුම්කරණයේ දී නිවැරදි සිද්ධාන්තයන් අනුගමනය කිරීමට මඟ පෑදෙනු ඇත.

## ආශ්‍රිත මූලාශ්‍රය

Acharya, P. K. (1981). *A dictionary of Hindu Architecture*. Oriental book reprint corporation, New Delhi

Acharya, P. K. (1978). *An encyclopedia of hindu architecture*. Bhopal: J.K. Pub. House

Acharya, P. K. (1981). *A dictionary of Hindu Architecture*. Oriental book reprint corporation, New Delhi

Achyuthan, A., & Prabhu, B. T. S. (1998). *Manusyalayacandrikabhasyam =: An engineering commentary on Manuṣyālayacandrika of Tirumangalat Nīlakaṇthan Mūsat*. Kiliyanad, Calicut: Vastuvidyapratisthanam

*Atom mean oxford—Google Search*. (n.d.). Retrieved July 17, 2024

*Oxford Advanced Learner's Dictioanary*. (2005). Oxford University press.

Varāhamihira, ., Subrahmanya, S. V., & Ramakrishna, B. M. (1947). *Varahamihir's Brihat samhita =: Brrhatsaṃhitā*. Bangalore City: Printed by V.B. Soobbiah.

Williams, M. (2005). *Sanskrit—English Dictionary*. Asian Educational Services, New Delhi.

*Yava, Yāva: 43 definitions*. (n.d.). Retrieved July 17, 2024, from https://www.wisdomlib.org/definition/yava

අප්පුහාමි, හර්මානිස්, වයි.ඒ.(2017) *වාස්තුවිද්‍යාව හෙවත් ගෘහනිර්මාණ ශිල්පය*, ගුණසේන සහ සමාගම, කොළඹ.

අලගියවන්න, පුවසති. (2004). *අලගියවන්න සංස්කෘත සිංහල ශබ්දකෝෂය*. සූරිය ප්‍රකාශන, කොළඹ 10.

ජීවනාථ, ශ්‍රී. (1997). *වාස්තුරත්නාවලි,* සෙනෙවිරත්න, ඩී. ආර්.(පරි), නුගේගොඩ, මොඩන් පොත් සමාගම

බුද්ධදත්ත, නාහිමිපොල්වත්තේ. (1998). *පාලි-සිංහල අකාරාදිය*. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල.

මුදියන්සේ, නන්දසේන. (1983). *වෛජයන්ත තන්ත්‍රය*. කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය